# සමන් දෙවියෝ



ආර්. ඇම්. රත්නපාල

LENDING
SABARAGAMUWA UNIVERSITY
LIBRARY

සමන් දෙවියෝ

| | |
|---|---|
| ACCESSION NO | 026569 |
| CLASSIFICA -TION NO | 133.9 |

**කර්තෘගේ වෙනත් කෘති:-**

1. ලංකාවේ වැද්දෝ
2. බැද්දෙන් ගමට
3. ජන ජීවිතය ජනශ්‍රැතිය හා රයිගම

# සමන් දෙවියෝ

(සමන් දෙවියන් පිළිබඳව කෙරෙන
පර්යේෂණාත්මක නිබන්ධයකි)


## ජී. ඇම්. රත්නපාල

බී. ඒ., අධ්‍යාපන ඩිප්., ඇම්. ඒ.


26569


ප්‍රකාශනය

ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

675, පී. ද. ඇස්. කුලරත්න මාවත.

කොළඹ 10.

පළමුවන මුද්‍රණය 1992

ISBN 955-20-0702-X

© ඊ. ඇම්. රත්නපාල

මෙම කෘතිය ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අනුග්‍රහයෙන් මුද්‍රාපිතයි. මෙහි අන්තර්ගතය මණ්ඩලයේ අදහස් පිළිබිඹු නොකරන බව සැලකුව මනාය.

පිටකවරය:–

තේමියදස කන්දෙවත්ත (ලලිතකලාවේදී)

මුද්‍රණය

ඊවන් මුද්‍රණ, එඩනේ එන්ටප්‍රයිසස් (ප්‍රයිවෙට) ලිමිටඩ
පැලැන්වත්ත, පන්නිපිටිය,

# හැඳින්වීම

දෙවි දේවතාවන් පිදීම ලක්දිව ජන ආගමයේ විශේෂ ලක්‍ෂණයකි. පොදු ජනතාවගෙන් වැඳුම් පිදුම් ලබන දෙවිවරු මහත් සංඛ්‍යාවක් මෙරට සිටිති. එයින් සමහරෙක් දිප ව්‍යාප්ත ව පුද පූජාවට ලක්වෙති. ඇතැමෙක් ප්‍රාදේශීය දෙවිවරුන් ලෙස වැඳුම් පිදුම් ලබත්. මේ දෙවිවරුන් අතුරින් සමහර දේවතා කෙනකුන් තමන් කෙරෙහි මෛත්‍රී, කරුණා පතුරුවා තමන් ආරක්‍ෂා කරති යි පොදු ජනතාව විශ්වාස කරත්. එසේ ම තවත් කෙනකුන් තමන්ට සතුරුකම් හා වැරදි සිදු කරන්නවුන්ට දඬුවම් පමුණුවති යි ද ඔවුහු විශ්වාස කරත්. සමන් දෙවියන් ජනතාවගේ වන්දන මානයට පාත්‍ර ව සිටින්නේ යහපත උදා කරන දේවතාවකු වශයෙනි. සෝවාන් ඵලයට පත් බුදුනුවකු ලෙස ජනතාවගෙන් වැඳුම් පිදුම් ලබන **සමන් දෙවියන්ගේ ප්‍රධාන දේවාලය පිහිටියේ රත්නපුරයේ ය.** දිවයිනේ බොහෝ පෙදෙස්වලදී සමන් දේවාල දක්නට ලැබුණ ද ඒවා අවශේෂ දෙවිවරුන් සමඟ වැඳුම් පිදුම් කරනු පිණිස ඉදි කරවන ලද සාමාන්‍ය දේවාල බව පෙනිණ. ඒ අතර මහියංගණයේ ද, බොල්තුඹේ, හා දූරණියගල ද තිබෙන සමන් දේවාල සුවිශේෂ තැනක් ගනී. එක් එක් ප්‍රදේශයට අධිපතිත්වය හොබවති යි සැලකෙන දේව ගණයා සමඟ ඒ ඒ අවස්ථාවන්හිදී සමන් දෙවියෝ ද බැතිමතුන් විසින් සිහිපත් කැරෙත්. එහෙත් සබර ගමුව, බින්තැන්න යන ප්‍රදේශයන්හි සුවිශේෂයෙන් ම සමන් දේව ඇදහිල්ල පවත්නා බව අපට දක්නට ලැබිණි.

දේව සංකල්පය බෞද්ධ සාහිත්‍යයේ නිතර සඳහන් වන්නකි. මංගල කරුණු විමසන්නට පැමිණි දේවතාවකුට බුදුන් වහන්සේ මංගල සූත්‍රය දේශනා කිරීම වැනි කතා මේ අතර ඉතා ප්‍රකට ය. ''සුර'' නමින් හැඳින්වෙන්නේ ද මේ දෙවිවරුන් ය. ශක්‍රයා ඒ දෙවිවරුන් අතර ප්‍රධානයා ය, දිව්‍ය රජ්ජුරුවෝ ය. පන්සිළු, මාතලී ආදීහු මේ දෙව්ලොව සේවයෙහි නිරත අවශේෂ දෙවිවරු ය. එක් එක් දිව්‍ය ලෝකවලට වෙන වෙන ම නම් ද පවතී. ඒවා ප්‍රධාන ස දිව්‍ය ලෝක වෙයි. බෞද්ධ සාහිත්‍යයෙහි මේ දෙවිවරුන් පිළිබඳ කතා ඉතා රසවත් ලෙස නිර්මාණය වී පවතී. දන් දීම, බණ කීම, බණ ඇසීම, භාවනා කිරීම ආදී නො එක් පිංකම් කොට මේ දෙව් ලෝවලින් එකක ඉපැදීමට බොහෝ බෞද්ධයෝ දැනුත් ඉමහත් ආශාවක් දක්වති. ඒ දෙව්ලොව ඉතා සැපවත් තැනක් ලෙස ඔවුන් විශ්වාස කරන නිසා ය. බෞද්ධ සාහිත්‍යයේ එන මේ දිව්‍ය රාජයන්ට, දිව්‍ය මතාවන්ට වෙන් කැරුණු දේවාල ආදිය නොමැත. එහෙත් සමන් දෙවියන් වැනි බොහෝ දෙවිවරුන්ට දේවාල තනා වැඳුම් පිදුම් කරනු ලැබේ. පූර්වෝක්ත දෙවිවරු වැඳුම් පිදුම් නො ලබති. මේ අනුව පෙනෙන්නේ ජනතාව විසින් පිහිට ඉල්ලනු ලබන නැතහොත් ජනතාව වදින පුදන සමන් දෙවියන් ඇතුළු අවශේෂ දේව ගණයාත් කලින් කී දේව

සමූහයාත් අතර ලොකු වෙනසක් පවතින බව ය. මේ දෙවිවරුන් ප්‍රාදේශීය වශයෙන් විශේෂ බලයක් ඇති අය ලෙස පොදු ජනතාව විශ්වාස කරති. සබරගමුවේ සමන් දෙවියන් මෙන් ම අනුරාධපුර ප්‍රදේශයේ අයියනායක දෙවියෝත් වළවේ ගං මිටියාවතේ මංගර දෙවියෝත් සුවිශේෂ වශයෙන් වැඳුම් පිදුම් ලබත්. මේ සියලු දෙවිවරු ජන ආගමයේ සංඝටකයෝ ය. ජන ආගමය හා සම්බන්ධ තොරතුරු හැදෑරීම ජනශ්‍රැතියේ ද එක්තරා අංගයක් වෙයි.

ජනතාවට බොහෝ සේවා කොට ඔවුන්ගේ ශුභ සිද්ධිය උදෙසා ඇප කැප වී ක්‍රියා කළ ප්‍රතාපවත් පුද්ගලයෝ සිය මරණින් පසු ව දෙවිවරුන් ලෙස පොදු ජනතාවගෙන් බුහුමන් ලැබුවෝ ය. මහසෙන් රජතුමා මින්නේරි දෙවියන් බවට පත් වූයේ එබැවිනි. ඔහුගේ මින්නේරි වැවත් ජේතවන විහාරයත් කෘෂිකාර්මික හා ආර්ථික සංවර්ධනයත් එම සංකල්පය ජනිත වීමට හේතු වූයේ ය. මෙවැනි දෙවිවරු මහත් සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ පොදු ජන හදවත් තුළ ජීවත් වෙති. සුමන කූටයෙහි සමන් දෙවියෝ ද මෙසේ බුහුමන් ලබන එක් දේවතාවෙකි. අපි සුමන දෙවියන් පිළිබඳ තොරතුරු විමසමින් ලක්දිව බොහෝ පෙදෙස්වල සැරිසරුවෙමු. මේ පොත ලියා වී ඇත්තේ එසේ සංචාරය කරමින් එක් රැස් කළ තොරතුරුත් ඔවුන් පිළිබඳ ව මෙතෙක් ලියා වී ඇති විවිධ කෘතීන්හි සඳහන් තොරතුරුත් එකිනෙක විශ්ලේෂණය කරමිනි.

අප මේ කාර්යයෙහිදී ජනශ්‍රැතියෙන් කරුණු ලබා ගත් බව සඳහන් කළ යුතු ය. අද බොහෝ දියුණු රටවල ජනශ්‍රැතිය ජන ජීවනයේ යථාර්ථය තේරුම් ගැනීම පිණිස උපයෝගී කැර ගන්නා බව අපි දනිමු. එංගලන්තය, සෝවියට් දේශය, අමෙරිකා එක්සත් ජනපදය, ජර්මනිය වැනි රටවල ජනශ්‍රැති හැදෑරීම විද්‍යාත්මක ලෙස සිදු කරනු ලැබේ. එහෙත් ශ්‍රී ලංකාවේ එවැනි සතුටුදායක තත්ත්වයක් තව ම උදා වී නැත. දේශීය හා විදේශීය උගතුන් සිය පෞද්ගලික රුචිකත්වය අනුව කරන ලද පර්යේෂණ හා විමර්ශන හැර විධිමත් ලෙස සිදු කැරුණු ජනශ්‍රැති පර්යේෂණ නිබන්ධ මෙරට ඇත්තේ අතළොස්සකි. සමන් දෙවියන් පිළිබඳ ව විමසීම සඳහා ගන්නා ලද මේ උත්සාහය ද අපගේ පෞද්ගලික රුචිය අනුව සිදු කැරුණකි. මේ සඳහා අපට උදව් උපකාරී වූ බොහෝ දෙනෙක් වෙති, ඔවුන්ගේ නාම ලේඛනයක් උපග්‍රන්ථයක් ලෙස මෙහි අගට එකතු කොට ඇත. ඒ සියලු දෙනාට ම අපගේ හෘදයාංගම කෘතඥතාව පිරිනැමේ.

මේ ග්‍රන්ථය පළ කිරීම පිණිස අනුග්‍රහ දක්වූ ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට ද ප්‍රකාශයට පත් කළ අප හිතමිත්‍ර එස්. ගොඩගේ මහතාට ද ශෝභන ලෙස මුද්‍රණය කළ පන්නිපිටියේ ඊවන් මුද්‍රණ ආයතනාධිපතිතුමා ඇතුළු සේවක මණ්ඩලයට ද අපගේ ස්තූතිය නිරවශේෂයෙන් ම හිමිවෙයි.

ඊ. ඇම්. රත්නපාල

''සුදර්ශන''
දම්මුල්ල - කරඳන.

# පටුන

හැඳින්වීම
සංක්ෂේත සූචිය
පරිච්ඡේද:-

1. සමනොළ කන්ද 9-14
2. සාහිත්‍යයේ සඳහන් වන සමන් දෙවියෝ 15-21
3. ප්‍රධාන සමන් දේවාල 22-47
4. සමන් දෙවියෝ කවරහුද? 48-63
5. සමන් දෙවියන් වටා ගෙතුණු රසකතා 64-67

උප ග්‍රන්ථ i තොරතුරු සැපයුවන්ගේ නාම ලේඛනය 68
,, ii ආශ්‍රිත පොත්පත් 69-70
වචන අනුක්‍රමණිකාව 71-72

## සිතියම් හා ඡායාරූප

සමන් දේව ඇදහිල්ල පවත්නා ප්‍රධාන ප්‍රදේශ දැක්වෙන සිතියම

1. සමන් දෙවියෝ
2. සමනොළ කන්ද
3. රත්නපුර මහ සමන් දේවාලය
4. බොල්තුඹේ සමන් දේවාලය
5. දඹුලු ලෙන් විහාරයේ තිබෙන සමන් දේව රූපය
6. වාර්ෂිකව සමනොළ කන්දට වැඩම කරන සමන් දේව ප්‍රතිමාව

# සංකේත සූචිය

| | |
|---|---|
| අයගි | – අපේ යටගියාව, ර. තෙන්නකෝන් |
| දූජන. | – දූදුරු ඔය බඩ ජන ඇදහිලි, ඇන්. ටී. කරුණාතිලක |
| දින. | – දිනමිණ පුවත්පත |
| දීප. | – දීපවංශය. |
| පයුග. | – පරංගි යුගයේ හෙළදිව, ඩී. පී. පොන්නම්පෙරුම |
| පු.යු. | – පුරාණ යුගය, තිසර ඉතිහාස අංක 2 |
| රස. | – රසවාහිනි සහරාව |
| රුඇවි. | – රුහුණේ ඇදහිලි හා විශ්වාස, පො. හේමසිරි හිමි |
| ලා.දෙ. | – ලාංකික දෙවිවරු, මාපොටේ චන්ද්‍රජෝති හිමි |
| ලං.ම. | – ලංකාවේ මහායාන අදහස්, මොරටුවේ සාසනරතන හිමි |
| ලංඉති. | – ලංකා ඉතිහාසය, විද්‍යාලංකාර සිංහල පරි. 1 භාගය |
| වක. | – වදන් කවි පොත |
| විපුලං. | – විදේශීන් දුටු පුරාණ ලංකාව, ඩී. පී. පොන්නම්පෙරුම |
| සද්. | – සද්ධර්මරත්නාකරය, ධර්මකීර්ති හිමි සංස්. |
| සපැලි. | – සපරගමුවේ පැරණි ලියවිලි, කිරිඇල්ලේ ඥාණවිමල හිමි |
| සපද. | – සපරගමු දර්ශන, කිරිඇල්ලේ ඥාණවිමල හිමි |
| සමන්ත. | – සමන්තකූට වණ්ණනා, කිරිඇල්ලේ ඥාණවිමල හිමි සංස්. |
| සැල. | – සැලළිහිණි සන්දේශය, සුමනසේකර සංස්. |
| සැස. | – සැවුල් සන්දේශය, පෙරේරා සංස්. |
| සිවි. | – සිංහල විශ්ව කෝෂය |
| හස. | – හංස සන්දේශය, ක්‍රිස්ටි ද සිල්වා සංස්. |
| AHR | – An Historical Relation of Ceylon, Robert Knox |
| AC | – Ancient Ceylon, H. Parker |
| CHS | – Ceylon History in Stone, R. Reven Haat |
| Inc | – Inscriptions of Ceylon, S. Paranavitana |
| JT | – Jungle Tide, John Still |
| JRAS | – Journal Royal Asiatic Socity |
| TMS | – Tomb Stones and Monuments in Ceylon |
| TGAP | – The God of Adam's Peak, S. Paranavitana |
| Ce | – Ceylon, Henry Marshel |
| Cey | – Ceylon, E. Tennent |
| CALR | – Ceylon Antiquary and Literary Register |

# 1

## සමනොළ කන්ද

සමන් දෙවියන් මහියංගණයට පැමිණි බුදුන් වහන්සේ හමු වී බණ අසා සෝවාන් වූ පුවත වාර්තා කරන මහාවංශ කතුවරයා එතුමන් මහියංගණයට පැමිණියේ සමන්තුළෙහි සිට බව පවසයි.[1] සමනොළ කන්ද එනමින් හැඳින්වෙන්නේ සමන් දෙවියන්ගේ නම මුල් කොට ගෙන බව මේ අනුව සිතිය හැකි ය. ශ්‍රී පාද කන්දට සමනොළ යන නම ව්‍යවහාර වීමත් සමන්තකූටයෙහි සමන් ලෙස මහාවංශ කතුවරයා කරන සඳහනත් නිසා මේ කන්ද සමන් දෙවියන්ගේ වාස භූමිය ලෙස සැලැකිය හැකි ය. සමන්+ඔළ යන පදය සන්ධි වීමෙන් සමනොළ යන වදන නිපැදී ඇති බව මෙයින් පෙනේ. සමන්ගේ බල පෙදෙස යනු එහි තේරුම ය. මේ අනුව සමන් දෙවියන්ගේ වාස භූමිය සුමන කූටය බව පැහැදිලි ය. සමන්තකූටය වටා පිහිටි සමස්ත භූමි ප්‍රදේශය ම සමනොළ අඩවිය නමින් වත්මන් ව්‍යවහාරයෙහි ද පවතී. සමනොළ අඩවියට අන්තර්ගත වන ප්‍රදේශයට රත්නපුර දිස්ත්‍රික්කයේ අතිවිශාල ප්‍රදේශයක් අයත් වේ.

සමනොළ කඳු මුදුන ශ්‍රී ලංකාවේ උස ම ගිරි ශිඛරය නූතනත් එය බැතිමතුන්ගේ මුදුන් මල්කඩ වන තරමට පූජනීයත්වයෙන් අග්‍රගණ්‍ය වී තිබේ. එයට හේතුව මුනිඳුන්ගේ වම් සිරි පා සටහන එහි තබන ලදැ යි පවත්නා විශ්වාසයයි. එහි මුනි සිරි පා සටහන තබන ලද්දේ සමන් දෙවියන්ගේ ඇරියුමෙන් බව ඒ පිළිබඳ සඳහන් වන හැම සාහිත්‍ය කෘතියකින් ම පාහේ කියැවෙයි. මේ හේතු නිසා සමන් දෙවියන්ගේ බල

---

1 මහාවංශය – බුද්ධදත්ත සංස්. –ගුණසේන සමාගම– (ම.ව.) 1.පරි. 33 ගාථා.

ප්‍රදේශය කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කිරීම මෙහිදී ප්‍රයෝජනවත් බව සඳහන් කළ යුතු ය.

සමන්තකූටයේ උස මුහුදු මට්ටමේ සිට මීටර 2265 ක් (හෙවත් අඩි 7360 ක්) වෙයි. මෙ තරම් උස් මට්ටමකින් යුත් තරණය කිරීම අතිශයින් අපහසු වූ මෙවැනි ගිරි ශීර්ෂයක් භක්තිමතුන්ගේ වන්දනාවට පාත්‍ර වීම එක් අතකින් විස්මය දනවයි. භූගෝලීය වශයෙන් ගත් කල මෙය පිහිටා ඇත්තේ උත්තරාක්ෂ 6°.48 ක්. නැගෙනහිරි දේශාංශ 80°.30 එකිනෙක කැපී යන ස්ථානයට සමීප ව ය. රුහුණු, මායා, පිහිටි වශයෙන් පාලන ප්‍රදේශ තුනකට ශ්‍රී ලංකාව බෙදී තිබුණු අවධියෙහි සමනොළ කන්ද අයත් වූයේ රුහුණට ය. අරාබි ලේඛනවල පවා මේ කන්ද හැඳින්වීම පිණිස "අල්රහුන්" යන වචනය භාවිත වී තිබීමෙන් ඒ බව සනාථ වෙයි.[1]

සමනොළ කන්ද පිහිටා තිබෙන කඳු වැටියේ සියලු ම කඳු මුදුන් ඒ දෙසට නැමී පවතින්නේ ආශ්චර්යක් ලෙසිනි. ඒ අතුරින් සමනොළ මුදුන අහස උසට නැගී සිටින්නේ චමත්කාරජනක දර්ශනයක් ද ප්‍රතාපවත් ලීලාවක් ද විදහා දක්වමිනි. සමනොළ කන්දේ පවතින පුනීලාකාර හෙවත් කේතුරූපාකාර හැඩය භූමියේ උත්ක්ෂිප්තයක් නිසා හට ගෙන ඇතැ යි යන්න භූගෝල විද්‍යාඥයන්ගේ විශ්වාසයයි.[2] දිගට විහිදී යන කඳු වැටියේ එක් කොටසක් පුනීලාකාර ව ඉහළට එසැවී යැම "හෝස්ට් විභේදය" යන නමින් හඳුන්වනු ලැබේ. එබැවින් සමනොළ කන්දේ මේ කේතුරූපාකාර හැඩයෙන් යුත් පෙදෙස 'සමනොළ හෝස්ට් ප්‍රදේශය' නමින් ද හැඳින්වෙයි. සමනොළ කන්දේ මේ කෝණාකාර ගිරි ශීර්ෂය, අහස වලාකුළුවලින් තොර පැහැදිලි දිනයක නම් ඉතා ඈතක සිට වුව ද දැක ගන්නට පුළුවන. රොබට් නොක්ස් මේ කන්දේ හැඩය කොණ්ඩ

---

1 Ceylon – E. Tennent. Vol – ii (Cey) Page 136.

2 භූගෝල විද්‍යා සමීක්ෂණ එන්. වීරතුංග. ඇම්. ඩී. ගුණසේන සමාගම. (භූ. ස.) 23, 24, පිටු.

කැවුමක් වැනි යයි පවසයි.[1] සමනොළ හෝස්ට ප්‍රදේශයට "දේවකූටය" යන නම ද ව්‍යවහාර වූ බව ආර්. එල්. බ්‍රෝහියර් මහතා පවසයි.[2] එසේ වන්නට ඇත්තේ මෙය සමන් දෙවියන් ගේ බල පෙදෙස වීම නිසා ය. බොහෝ කලක් බාදනයට පාත්‍රව ශේෂ වූ ගල් පර්වත රාශියක් සමන්තකූටය වටා පිහිටා තිබේ. තරණය කිරීම අතිශයින් ම දුෂ්කර බැන සමනොළ දෝතුරුගල, ලීනි හෙළ, ඔත් කන්ද ආදී ලිහා පර්වත ඒ අතර වේ. ලංකාවේ ප්‍රධාන ගංගා කිහිපයක් ම ආරම්භ වන්නේ සමන් දෙවියන්ගේ බල ප්‍රදේශයෙනි. මහවැලි ගඟ සමනොළ අඩවියෙන් ඇරඹී ඊසාන දෙස බලා ගොස් ත්‍රිකුණාමලයෙන් මුහුදට වැටේ. කළු, කැලණි දෙ නදීහු බටහිර බලා ගොස් කළු නදිය කළුතරදීත් කැලණි නදිය කොළඹ අසලදීත් මුහුදට වැටෙත්. සමනොළ අඩවියෙන් ඇරඹෙන වළවේ ගඟ හම්බන්තොටදී සයුර වැළඳ ගනී.

කළු ගඟේ ශාඛාවක් වන කුරු ගඟේ පිහිටි බෝ පත් පිටි ඇල්ල ද සමනොළ අඩවියේ අලංකාරයට හේතු වී තිබේ. කුරුවිට නගරය අසල දෙවි පහළ නමැති ගම්මානයට පිවිසි කල මේ දිය ඇල්ල දකින්නට පුළුවන. දිවයිනේ බොහෝ පෙදෙස්වලට සමනොළ කන්ද දර්ශනය වන්නාක් මෙන් ම ඈත මුහුදේ යාත්‍රා කළ නැව්වලට ද එය පෙනුණු බව රාජාවලියේ සඳහන් වෙයි. විජය කුමරා ඇතුළු සත් සියයක් පිරිස නැව් නැගී මුහුදේ යාත්‍රා කරන කල සමන්තකූට පර්වතය ඔවුන්ට දකින්ට ලැබුණු බව රාජාවලිය පවසන්නේ මෙසේ ය.

> "…. එකද උපන් සත් සියයක් යෝධ පිරිවරත් නැවට දමා මූදට නංවා ඇරිය තැන නැව රුහුණු රට දෙසට ගොඩ බලා උන් විට එනුවරවාසීන්ගේ උගහටින් සමන්තකූට පර්වතය මහ මුහුද මැදදී දැක්කාහ.[3]"

---

1 An Historical Relation of Ceylon - Robert Knox. Gunasena Ed. chap. 11. (ANR.) Page 5.

2 Seeing Ceylon - R. L. Brohier. Lake House (SC) Page 235.

3 රාජාවලිය - ඒ. වී. සුරවීර සංස්. ලේක්හවුස් කොළඹ (රාජා) 162 පිටුව.

නව වැනි සිය වසේ විසූ ඉබන් බුර්දාද්බෙ ද සඳහන් කරන්නේ මේ රටට පැමිණෙමින් සිටි යාත්‍රිකයන් ලංකාවට ළඟා වීමට දින විස්සකට පෙර සිට ම සමන්කුළ දුටු බව ය. මේ කන්දේ ශිඛරය නිතර වලාකුළුවලින් වැසී තිබුණු බව ද එහි පාමුල අවට පෙදෙස්වල පද්මරාග හා වෙනත් මැණික් වර්ග හමුවන බවද බුර්දද්බේ පවසයි.[1] ඉන් පසු කලෙක ලංකාවේ සංචාරය කළ (ක්‍රි. ව. 1340 දි) ඉබන් බටූතා ද සමනොළ කන්ද පිළිබඳ ව මෙවැනි ම විස්තරයක් ඉදිරිපත් කරයි. සමනොළ කන්දේ පිහිටුවා ඇතැ යි සැලැකෙන ආදමගේ පා සටහන වන්දනා කරනු පිණිස මුස්ලිම භක්තිකයෝ ලංකාවට පැමිණිය හ. එහෙත් ඔවුනු මෙහිදි පිදුම් බලන සමන් දෙවියන් ගැන යමක් සඳහන් නො කළ හ.

සමන් දෙවිඳුන්ගේ වාසභූමිය ලෙස සැලැකෙන සමනොළ කන්ද පිළිබඳ තවත් පැරණි ඓතිහාසික වාර්තාවක් අපට ලැබෙන්නේ මණිමේඛලා නම් ද්‍රවිඩ කාව්‍යයෙනි. කෝවලන් හා මාධවී යන අද දෙනාගේ දියණියක වූ මණිමේඛලාවගේ චරිතය වටා බෞද්ධාගමික පසුබිමක් ඇති ව ලියැවී ඇති මේ කාව්‍යයේ සමනොළ කන්ද පිළිබඳ ව කියැවෙන්නේ මෙසේ ය.

> "....රත්නදීප නමින් ලක්ෂණ ද්වීපයක් ඇත්තේ ය. එහි ඉතා උසට බැබළෙන සමන්තකූට පර්වත නමින් පූජනීය පර්වතයක් ඇත."[2]

චීන සංචාරක ස්වාමීන් වහන්සේ නමක වූ ෆාහියන් හිමියන්ගේ ද වජ්‍රබෝධි හිමියන්ගේ[3] ද වාර්තාවල සමනොළ කන්දත් එහි පිහිටා ඇතැයි සැලැකෙන සිරි පා සටහන ගැනත් යම් යම් විස්තර සඳහන් වෙතත් සමන් දෙවියන් පිළිබඳව ඒවායේ කිසිවක් නො කියැවෙයි. "සමන්තකූට" යන නම මේ වාර්තාවලින් සමහරක සටහන් වී තිබීම වැදගත් ය.

සමන් දෙවිඳුන්ගේ බලප්‍රදේශය ලෙස සැලැකෙන සමන්තකූටය චිත්තාකර්ෂණීය සොබා සුන්දරත්වයකින් යුක්ත ය.

---

1 විදේශීන් දුටු පුරාණ ලංකාව – සී, පි. පොන්නම්පෙරුම – පේරාදෙණිය (විපුලං) 94 පිටුව.

2 මණිමේඛලා චම්පු – හිස්සැල්ලේ ධම්මරතන හිමි සංස්. 29 පිටුව.

3. Journal Royal Asiatic Society – Vol – 29 (JRAS) Page 82.

එහි පිහිටීම ම ඒ සුන්දරත්වයේ අපූරුව විදහා පායි. කඳු පාමුල සිට ඉහළට නැඟී යන කල එහි ජෛව පරිසර පද්ධතිය ද කෙමෙන් කෙමෙන් වෙනස් වෙයි. පහළ කොටසේ පළල් පත්‍රවලින යුත් උසට වැඩෙන වෘක්ෂලතාවලින් ගැවසුණු ඝන කලාපීය වනාන්තර දක්නා ලැබේ. ගිරි මුදුනට ළං වන කල දකින්නට ලැබෙන්නේ ඊට වඩා වෙනස් කඳුකර වෘක්ෂලතා ය. කීන, දඹු, මිහිරිය වැනි වෘක්ෂ ඒ අතර වෙයි. ඊට අමතර ව මීවන පවුලට අයත් විවිධ හැඩයෙන් යුත් ශාක වර්ග ද පුස් හා උඩවැඩියා වර්ග ද මෙහි සුලබ ය. උඩවැඩියා බිංගෝනියා හා සුවඳැති කුඩලු වර්ගත් ලයිකන් හා ඇල්ගී ශාකත් තමන්ට දකින්නට ලැබුණු බව සමනොළ කන්දේ තොරතුරු විමසමින් එහි සැරිසැරූ ජෝන් ස්ටිල් මහතා සඳහන් කරයි.[1] එපමණක් නොව යටත් විජිත සමයේදී සමනොළ නැංගා වූ විදේශීය සංචාරකයින් හැම කෙනෙක් ම පාහේ මෙහි ගහ කොළ හා සුන්දරත්වය ගැන වාර්තා කිරීමට අමතක නො කළ හ.

සමනොළ කන්දට නගින බැතිමතුන් ශ්‍රී පාදය වන්දනා කරන්නට යනමෙන් සමන් දෙවියන් සිහිපත් කරමින් ඔවුන්ගේ පිහිට යැද යැද ය. එසේ නැඟ සිරිපතුල වඳින ඔවුහු ඒ අසල ඇති සමන් දේවාලයට ද පඬුරු පූජා කොට සමන් දෙවිඳුන්ට පින් දෙති. ඒ සමග ම උදෑසන හිරු නැග එන කල අරුණැල්ලේ ඉර සේවය නරඹා එහි සුන්දරත්වයේ රසය විඳින්නට ද අමතක නො කරති. නැගෙනහිරින් පායන හිරු වරක් ගිලෙමින් ද යළි නැඟෙමින් ද මතු වෙමින් අවුත් ඝනාන්ධකාරය දුරු වී යන කල කන්දේ කේතු රූපාකාර කොටසේ සෙවණැල්ල එහි ප්‍රතිවිරුද්ධ දෙසින් ඇති කඳු වැටිවලත් අහසේත් දර්ශනය වෙයි. එවිට සමනොළ කන්දේ එක් දෙසක ආලෝකයත් අනෙක් පැත්තේ අන්ධකාරයත් පවතී. මෙය බොහෝ දෙනාගේ විස්මයට හේතු වේ.

සමනොළ කන්දට නැඟෙන ප්‍රධාන මාවත් කිහිපයක් වෙයි. රත්නපුර පාර, හැටන් පාර, හා කුරුවිට පාර ඒ අතුරින් ප්‍රධාන ය. බලංගොඩ සිට මාරතැන්න ඔස්සේ තවත්

---

1 **Jungle Tide : John till – Colombo (JT) Page 17.**

පාරක් විහිදෙයි. ඇහැල කණුව අසලදී රත්නපුර පාරට එක් වෙන අනෙක් පාරක් සපුගස්තැන්න දෙසින් විහිදෙයි. ඉබන් බටුනා සමනොළ නගින ප්‍රධාන පාරවල් දෙක හඳුන්වන්නේ ''බබා පාර හා මමා පාර'' යනුවෙනි. කලක් භාවිත, කොට අත්හැර දමන ලද පාරක් ද කුරුවිට අසල තිබෙන බව අපට දකින්නට ලැබිණි. මෙය ගල් අතුරා හොඳින් සකස් කරන ලද පාරකි. එසේ ම නුරිය මාලිබොඩ යන ගම ඔස්සේ සිරි පාදේ යන පාරක් ද තිබේ.

සමන්තකූටයෙහි තබා ඇතැයි විශ්වාස කැරෙන බුදු සිරි පා සටහන වන්දනා කිරීමට යන භක්තිමතුන් සමන් දෙවිඳුන්ගේ පිහිටාරක්ෂාව ප්‍රාර්ථනා කරන්නේ මේ පෙදෙසට අධිපති දේවතාවා සමන් දෙවියන් ලෙස ඔවුන් පිළිගන්නා බැවිනි. එසේ ම සමන් දෙවිඳුන් සිරිපා සටහන ආරක්ෂා කිරීමට බුදුන් වහන්සේට ප්‍රතිඥා දී ඇතැයි ඔවුන් විශ්වාස කරන බැවිනි,•

---

• ජනශ්‍රැති

# 2

# සාහිත්‍යයේ සඳහන් වන සමන් දෙවියෝ

ශ්‍රී ලාංකික පොදු ජනතාවගේ ගෞරවාදරයට හා වන්දනා මානනයට ලක් ව සිටින දෙවි දේවතාවන් අතර සමන් දෙවි- යන්ට අද්විතීය ස්ථානයක් හිමි වන බව අපි දනිමු. එබැවින් සමන් දෙවියන් හා ඔවුන් වහන්සේ සම්බන්ධ විවිධ කරුණු පිළිබඳ විමර්ශනයක යෙදීම ඉතා වැදගත් ය. සමන් දෙවියන් ගැන මුල් වරට ම අපට අසන්නට ලැබෙන්නේ, බුදුන් වහන් සේගේ ලංකා ගමන ගැන මහාවංශ කතුවරයා කරන සඳහනත් සමඟ ය. බුදුන් වහන්සේ මහියංගණයට වැඩම කළ අවස්ථා- වෙහි සමන්තකූටයේ වෙසෙන මහා සුමන දෙවි රජු එහි පැමිණ බණ අසා සෝවාන් පලයට පත් වූ බව මහාවංශය සඳ හන් කරන්නේ මෙසේ ය.

> "සොතාපත්ති ඵලං පත්වා සෙලෙ සුමනකූටකෙ
> මහා සුමන දෙවින්දෝ පූජියං යාචි පූජියං"

සුමන දෙව් රජ මෙහිදී පූජාවට යමක් බුදුන් වහන්සේ ගෙන් ඉල්ලා සිටියේ ය. එවිට බුදුන් වහන්සේ සිය හිස පිරි මැද කේශ ධාතු මිටක් පමණ සුමන දෙවි රජුට දුන්නේ ය. රන් කරඬුවකින් ඒ කේශ ධාතු පිළිගත් හෙතෙම මුනිඳුන් වැඩ සිටි තැන සත් රියනක් උසට ස්තූපයක් තනවා ඒවා එහි තැන් පත් කෙළේ ය.[1] මේ ප්‍රකාශයෙන් හෙළි වන්නේ සමන් දෙවි යන් සුමන කූටයේ වාසය කළ බව ය. ඒ බව මෙහි කලින් ද සඳහන් කරන ලදී. සුමන කූටය වනාහී ලෝ පරසිඳු ශ්‍රී පාද

---

1 ම. ව. පොල්වත්තේ බුද්ධදත්ත හිමි සංස්. 1 පරි. 33, 34, 35 ගාථා.

කන්ද හෙවත් සමනොළ කන්ද ය. මෙය සමනොළ කන්ද නමින් හැඳින්වෙන්නේ ද සුමන හෙවත් සමන් දෙවියන් නිසා ය, සමන්ගේ බල ප්‍රදේශය යන්න එයින් ගම්‍යමාන වන අරුතයි. මුනිඳුන්ගේ ලංකා ගමන් පිළිබඳ ව සඳහන් කැරෙන දීපවංශයේ හා සමන්තපාසාදිකාවේ සමන් දෙවියන් පිළිබඳ ව කිසිවක් සඳහන් නොවීම ගැන ද විමසිය යුතු ය. ඇතැම් විට මහා විහාරයේ භික්ෂූන් බුදුන් වහන්සේගේ ලංකා ගමන ගැනත් සමන් දෙවියන් ගැනත් එවක එතරම් සැලැකිල්ලක් නොදක්වන්නට ඇතැයි ද සිතන්නට පුළුවන.

බුදුන් වහන්සේගේ දෙවැනි ලංකා ගමන හා සම්බන්ධ සම්බ්ධ සුමන නම් දේවතා කෙනකු පිළිබඳ විස්තරයක් මහාවංශයේ සඳහන් වෙතත්[1] ඒ අපගේ ප්‍රස්තුතයට අදාළ සමන් දෙවියන් නොවන බව ඉඳුරා ම පැහැදිලි ය. මහාවංශයට අමතර ව ක්‍රි. පූ. තුන් වැනි ශත වර්ෂයට අයත් ගිරි ලිපියක ද සුමන යන වචනය සඳහන් වන බව කිරිඇල්ලේ ඥාණවිමල හිමියෝ පවසති. සමනොළ කන්දේ සිරි පා සටහන ඇතැයි සැලැකෙන මහා පර්වතය වටා තිබූ සෙල්ලිපි කිහිපයක් ම තමන් වහන්සේට කියවන්නට ලැබුණු බවත් ඒවා බ්‍රාහ්මී අක්ෂරවලින් යුත් බවත් ඒ අතර සුමන යන වචනය පැහැදිලි ව තිබූ බවත් ඥාණවිමල හිමියෝ පමසත්.[2]

අනුරාධපුර සමයේ හා පොළොන්නරු සමයේ සාහිත්‍ය කෘතීන්හි ද සෙල්ලිපිවල ද සමන් දෙවියන් පිළිබඳව විස්තරයක් සඳහන් වී නොමැත්තේ ඒ වකවානුවෙහි සමන් දේව ඇදහිල්ල ජනතාව අතර ව්‍යාප්ත වී නොතිබුණු නිසා විය හැකි ය. එසේ ම සමන් දෙවියන් ඇදහීම හුදෙක් ශ්‍රී ලංකාවේ රුහුණට බර ව රට මැද ප්‍රදේශයට සීමා වී තිබුණු බව පෙනේ. මහවැලි ගඟෙන් දකුණේ සබරගමුව ඇතුළු විශාල ප්‍රදේශයක් මෙයට අයත් වූ බව ද පෙනේ.

---

1 ම. ව. ශ්‍රී සුමංගල සංස්. 4 පිටුව 52, 53 පේළි

2 සපරගමු දර්ශන – කිරිඇල්ලේ ඥාණවිමල හිමි. ශාස්ත්‍රෝදය රත්නපුර 1967 (ස. ද.) 10 පිට

සමන් දෙවියන් පිළිබඳ ව පූජාවලියේ දකින්නට ලැබෙන්නේ ඉතා රමණීය විස්තරයකි. බුදුන් වහන්සේ සිය තෙ වැනි ලංකා ගමනයේදී කැලැණියට වැඩම කළ අවස්ථාවෙහි සුමන දෙවියන් ද එහි පැමිණ උන්වහන්සේ අමතා කරන කතාවක ස්වරූපයෙන් පූජාවලී කතුවරයාණන් වහන්සේ කරන මේ විස්තරය දෙස බලන්න.

"....කරුණා නිධාන වූ තිලෝගුරු බුදු රජාණනි! මේ නැගෙනහිරි දිසා භාගයෙහි පස් ගවුවක් උසින් ඉඳුනිල් මිණි ගල් පර්වතයක් සේ ආකාශයෙහි ගැහැටි ගැහැටි සිටිනා සේ පෙනෙන්නා වූ සමන්ත කූට පර්වතය නම් ස්වල්ප වූ පර්වතයක් නොවෙයි අනන්තාපර්යන්ත වූ බුදුන්ගේ පාද ශ්‍රී ලබන්නා වූ පර්වතයෙක. දුනුදු නුඹ වහන්සේ ද මාගේ කුළු නමැති ඔටුන්නෙහි තෙල ශ්‍රී පාද නමැති අග මිණි රුවන පළඳවා ලෝ වැඩ නළ මැනව."[1]

මේ අවස්ථාවෙහි බුදුන් වහනාසේ සමන්තකූටයට වැඩ තම වාම ශ්‍රී පාදය සලක්ෂණ කොට පිහිටුවා වදාළ බව පූජාවලිය වැඩි දුරටත් කියයි.

සද්ධර්ම රත්නාකරය ද මෙ වැනි ම රමණීය විස්තරයක් ඉදිරිපත් කරයි. එහිදි සමන් දෙවියෝ මුනිඳුන් හමුවේ ඇදිලි බැඳ ගෙන සමන්තකූටයෙහි සොබා සුන්දරත්වය වර්ණනා කරති. එවිට සිරිපදලස තබන ලෙස ද බුදුන් වහන්සේට ආරාධනා කරති.[2] සමන්තකූට වර්ණනා කාව්‍යයෙහි දකින්නට ලැබෙන්නේ ද මෙවැනි ම විස්තරයකි. මේ බලන්න.

"අන්තො ගධා නූන මයම්පි තුය්හං
දයාය තස්මා එණිතං විමෙසං
කරෝහි මය්හං භවනම්හි ධීර
පාදංසුනා, තීව පවිත්ත රූපං (721)

---

1. පූජාවලිය – ඒ. තෙන්නකෝන් සංස්. – කොළඹ (පූජා) 767 පිටුව

සොයං නමගා දිස්සති තො පුරත්ථ
භූ මංගනා මොලි සිරිං වනකේෂා
සමන්තකූටෝති සමන් චක්ඛු
ජානාති ලෝකො වසතිං මමෙතං (722)

සමන්තකූට වණ්ණනාවෙහි සඳහන් වන කාව්‍යාවලියෙන් ප්‍රකාශ කැරෙන්නේ සමන් දෙවියන් බුදුන් වහන්සේ හමුවෙහි කරන ප්‍රකාශයකි. නාගයන්ට අනුග්‍රහ කොට දක්වූවාක් මෙන් ම, ධීරයන් වහන්ස මගේ භවනෙහි ද ශ්‍රී පාද රශ්මියෙන් පිවිතුරු වූ සටහනක් කළ මැනවි. එසේ ම පෙර දිගින් පෙනෙන පර්වතයෙහි අපූරුවට මුදුන් වී පෙනෙන මාගේ වාස භවනය සමන්තකූටය සේ ලෝකයා දනිති. යනු මේ ගාථාවල සාරාංශයයි. ඉනික්බිති සමන් දෙවියෝ සමනොළ කන්දේ සොබා සුන්දරත්වය බුදුන් වහන්සේ හමුවෙහි වර්ණනා කරති.

එහි මෙසේ සඳහන් වේ. නොයෙක් වන රේඛායෙන් බබළන වේගවත් ජලධාරා ඇති ගඟුලැලිවලින් ගැවසුණු මඳ රන් වන් වූත් නිල් වන් වූත් අරුණුවන් වූත් ලපළු පෙළ සහිත සමන්තකූටය මේ කුළක් වැනි ය. ගංගා නමැති ස්ත්‍රීන් ඇති, පර්වත නමැති කිරුළු ඇති සමීප පර්වත නමැති ඇමැතියන් ඇති පර්වත නමැති පෘථිවි පාලකයෙක් ලංකාද්වීපය නමැති අංගනයෙහි වේ.[1]

මෙසේ සමන් දෙවියන් විසින් මුනිඳුන් අබිමුවෙහි සිට සමන්තකූටය විස්තර කරනු ලබන ආකාරයෙන් සමන්තකූට වණ්ණනාවේ සඳහන් වර්ණනය ඉතා ව්‍යක්ත කාව්‍ය නිර්මාණයකි. මේ හැම කරුණකින් ම පැවසෙන්නේ සමන් දෙවියන් සාහිත්‍යයට පිවිස ඇත්තේ බුදුන් වහන්සේගේ ලංකා ගමන් සමග බව ය. දීපවංශයෙහිත් සමන්තපාසාදිකාවෙහිත් මේ පිළිබඳ කිසිවක් නොසඳහන් බව පෙර ද කියන ලදී. එහෙත් සමන් දෙවියන් වරින් වර පොදු ජනතාවගේ අවධානයට ලක් වී තිබෙන බව පසු කාලීන සාහිත්‍ය කෘතීන්ගෙන් පෙනෙයි.

---

1 සමන්තකූට වණ්ණනය – කිරිඇල්ලේ ඤාණවිමල හිමි. සංස්.

හංස සන්දේශයෙහි ද සැවුල් සන්දේශයෙහි ද සමන් දෙවියන් පිළිබඳ ව කැරෙන වර්ණනාවන් ගැන මෙහිදී සඳහන් කළ හැකි ය. හංස සන්දේශයෙහි සමන් දෙවියන් පිළිබඳ ව මෙසේ දක්වෙයි.

''මහත් තෙදැති පුල්වන් සුරිඳු මුල් කොට
දිමුත් සමන් බොක්සැල් සුරිඳු නෙක් කොට (202)

හංස සන්දේශ කතුවරයා මෙහි සමන් බොක්සැල් නමින් හඳුන්වන්නේ සමන් දෙවියන් ය.

අලගියවන්න මුකවැටිතුමා සිය සැවුල් සන්දේශයෙහි සුමන දෙවියන් පිළිබඳ ව මෙසේ සඳහන් කරයි.

''සුමන සමන් සුර රජු සිරි පද නැම ද (201)
පුවතර බිසෝ දෙවියන් පද කමල වැ ඳ (202)
කුමර සුරිඳු යුග සිරි සරණ සියපත (203)

අලගියවන්නයන්ගේ සඳහන අපට වැදගත් වන්නේ සමන් දෙවියන් පමණක් නොව ඔවුන්ගේ බිසොවක හා දරුවකු ගැන ද හඳුන්වා දීමක් කැරෙන බැවිනි. ලංකාතිලක විහාරයෙහි මේ දෙව් පවුල සිතුවම් ගත කොට තිබෙනු දැක්ක හැකි ය. වර්තමානයෙහි මෙවැනි අදහසක් ලක්වැසියන් තුළ දක්නා නොලැබෙන බව සඳහන් කළ යුතු ම ය. එහෙත් 16-17 වැනි සියවස්වල මේ අදහස මෙ රට ජනතාව තුළ පවතින්නට ඇතැයි සිතන්නට පුළුවන.[1]

වදන් කවි පොතෙහි 71 වැනි පද්‍යයෙහි සමන් දෙවියන් පිළිබඳ ව සඳහන් වන්නේ, ''සිද්ධ කිරිඇලි සමන් බොක්සැල් විබීසන සිවුවරම් රජපති'' යනවෙනි.

මෙහි සමන් දෙවියන් වරම් රජ දරුවකු ලෙස සඳහන් වෙයි. කිහිරැලි, සමන්, බොක්සැල්, හා විබීසන යනු මෙහි

---

1 සමන් දෙවියන් – බිසෝ දෙවියන් කුමාර දෙවියන් යනුවෙන් සමන් දේවාල සන්නයෙහිද සඳහන් වේ. එය කෝට්ටේ රජකළ සවැනි පැරකුම්බා රජු විසින් පිහිටුවන ලද්දකි. බලන්න (Ceylon Antiquary 1916 July පිටු 36–38)

සඳහන් වරම් රජවරු ස. එහෙත් හංස සන්දේශ කවියා "සමන් බොක්සැල්" එක දෙවියකු ලෙස හඳුන්වා තිබීම ගැනත් මෙහි දෙදෙනකු වශයෙන් දක්වීම ගැනත් අවධානය යොමු කළ යුතු ය.

සැළලිහිණි සන්දේශයෙහි සමන් දෙවියන් ගැන සඳහන් වන්නේ මේ අයුරිනි.

"සුර රද සමන් සමගින් සුරඟන එවර
පැහැනද මදරා පරසතු මල් පතර
කර පුද වඳින රැඳි මුනි සිරි පා තඹර
සකි සඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර"[1]

සමන් දෙවියන් සුරඟනන් පිරිවරා ගෙන වුත් සිරිපදලස වන්දනා කරන බව මෙයින් කියැවෙයි. කෝට්ටෙ යුගයේදී සමන් දෙවියන් පිළිබඳ ව බහුල වශයෙන් ම සඳහන් වන බව පෙනී යයි. දඹදෙණි යුගයෙහි එය ආරම්භ වී පසුව ව්‍යාප්ත වූ සේයාවක් ද මේ මූලාශ්‍රයන් අනුව දර්ශනය වන බව කිව හැකි ය. කෙසේ වෙතත් අනුරාධපුර, පොළොන්නරු අවධිවලදී නම් සමන් දෙවියන් පිළිබඳ පොදු ප්‍රචාරයක් උගතුන් හා පොදු ජනතාව අතර පැවැති බවත් මූලාශ්‍රයන්ගෙන් හෝ පුරාවිද්‍යාත්මක සාක්කිවලින් හෝ ස්පුට නොවන බව සඳහන් කළ හැකි ය. ප්‍රාග් බෞද්ධ යුගයේ සිදුවීම්වලින් පසු ව සමන් දෙවියන් පිළිබඳ අසන්නට ලැබෙන්නේ දඹදෙණි යුගය හා සම්බන්ධව වීම මෙහිදී අපේ සැලැකිල්ලට ලක් විය යුතු කරුණකි. දඹදෙණි යුගය වන විට මෙය එක් වර ම පැන නැංගේ යැයි කීමට ද පුළුවන් කමක් නැත. මෙය සමාජයෙහි එතෙක් පැවැති ආගමික විධියක් ව්‍යාප්ත වීමක් සේ සැලකුව ද සාවද්‍ය නො වෙති යි සිතමි. සමන් දෙවියන් ඇදහීම ප්‍රචාරයට පත් වන විට ඒ පිළිබඳ ප්‍රතිමා නෙළීමට ද කලාකරුවන් පෙළඹී ඇති අයුරු දැක්ක හැකි ය.

ශ්‍රී පාද වන්දනාවේ යන බැතිමතුන් සමන් දෙවියන් සිහිපත් කරමින් ප්‍රබන්ධ කරන ලද ජන කවි රාශියක් වෙයි.

---

1 සැළලිහිණි සන්. සුමනසේකර සංස්. 25 කව.

ගමන් විඩාව මග හැර ගැනීමට ගයන කවි අතරට සමන් දෙවි-
යන් ගැනද සඳහන් කිරීමට ජනකවියා අමතක නො කෙළේය.

''බල ඇති සමනල වදින ලෙසින් නේ
අලස නොවී එහි හැම දෙන යන් තේ
බල මහිමය එසුමන දෙවියන් නේ
......................................................................
මෙතන පටන් හිමයයි දැන ගන් නේ
සමන් සුරිඳු අණ මෙහි පවතින් නේ

යනු එ මහත් ජන කවි සංඛ්‍යාවෙන් කොටසකි.

# 3

# ප්‍රධාන සමන් දේවාල

ලක්දිව විවිධ ප්‍රදේශවල පන්සල් ද ආශ්‍රිත ව දේවාල ගොඩ නංවා තිබේ. ඒ දේවාල අතර සමන් දේවාල ද දැක්ක හැකි ය. වැඩි වශයෙන් විෂ්ණු දෙවියන් අදහන පෙදෙස්වලත් අයියනායක දෙවියන් අදහන පෙදෙස්වලත් අවශේෂ දේවතා වකු ලෙස සමන් දෙවියන්ට ද වත්පිළිවෙත් කරනු ලැබේ. එහෙත් සමන් දෙවියන් උදෙසා කැප වුණු ප්‍රධාන සමන් දේවාලය ඉදිකොට තිබෙන්නේ රත්නපුරයේ ය. ඊට අමතර ව තවත් ප්‍රධාන සමන් දේවාල හතරක් දක්නා ලැබේ. ඒ මේවාය.

- \+ සමනොළ කන්ද මුදුනේ පිහිටි සමන් දේවාලය
- \+ මහියංගණයේ අලුත්නුවර මහ සමන් දේවාලය
- \+ බොල්තුඹේ සමන් දේවාලය
- \+ දූරණියගල සමන් දේවාලය.

සමනොළ කන්දේ සමන් දේවාලය:-

සිරිපා වන්දනා සමයේදී මේ සමන් දේවාලයට ඉතා වැදගත් තැනක් හිමි වෙයි. මෙහි පුද පූජාදිය පවත්වනු ලබන්නේ හුදෙක් සමනොළ සිරිපා වන්දනාව පවත්නා සමසක පමණ කාලය තුළ දි පමණ ය. මෙය රත්නපුරයේ දේවාලය මෙන් විශාල දේව මන්දිරයක් ද නොවේ. කුඩා කාමරයකි. මෙය ඉදි කොට ඇත්තේ සිරිපදලස පිහිටි පූජනීය පර්වතය පාමුල රත්නපුර පාර දෙසට මුහුණ ලා ය. මේ සමන් දේවාලය පිළිබඳ වැඩි විස්තරයක් ඓතිහාසික හෝ සාහිත්‍යමය හෝ මූලාශ්‍රයන්හි සඳහන් වී තිබෙනු දැක්ක නො හැකි ය. රාජාවලිය සඳ

හන් කරන අන්දමට මේ සමන් දේවාලය ඉදි කරවනු ලැබ ඇත්තේ මහා පරාක්‍රමබාහු රජු විසිනි.[1] ඒ බව රාජාවලියේ කියැවෙන්නේ

"සමනොළයට ගොස් ශ්‍රී පාදය වැඳ සමන් දෙවිඳුගේ දේවාලය කරවා" යනුවෙනි. එහෙත් මේ කාරණය පිළිබඳ කිසිදු තොරතුරක් පූජාවලිය වැනි අනෙක් මූලාශ්‍රයක දක්නා නොලැබීම විමතියට කරුණකි. කෙසේ වෙතත් රාජාවලි කතු වරයා ඉදිරිපත් කරන යථෝක්ත ප්‍රකාශය පිළිගනිතොත් සමනොළ කන්දේ සමන් දේවාලය ඉදි කරවන ලද්දේ පොළොන්නරු සමයේ රජපත් වූ මහා පරාක්‍රමබාහු රජතුමා විසිනැ යි සැලකිය යුතු ය.

දඹදෙණියේ රජ කළ දෙ වැනි පැරකුම්බා රජු විසින් දේව ප්‍රතිරාජ ඇමතිතුමා ලවා ශ්‍රී පාදස්ථානයට කරවන ලද පුද පූජා ගැන දීර්ඝ විස්තරයක් පූජාවලී කතුවර බුද්ධපුත්‍රයන් වහන්සේ ද සිය කෘතියෙහිලා සඳහන් කරති.[2] දේවප්‍රතිරාජ ඇමැතිතුමා ගම්පොළට ගොස් සමන් දේව ප්‍රතිමාවක් කරවන ලද බවත් එය සිරිපා මළුවේ පිහිටුවන ලද බවත්, පූජාවලියේ සඳහන් ය. "දෙව් රජාණන් මළුයෙහි පිහිටුවා" යන්න මිස දේවාලයක් තැන වූ බවක් එයින් නො කියැවෙයි. දේවප්‍රතිරාජයන් පැරණි දේවාලයෙහි තමන් තැන වූ ප්‍රතිමාව තැන්පත් කෙළේ ද නැත හොත් අභිනව දේවාලයක් තනවා එහි එය තැන්පත් කෙළේ ද යන්න පැහැදිලි නැත. ඉහත සඳහන් පූජාවලී පාඨය ධ්වනිත කරන්නේ අලුතෙන් ම සමන් දේවාලයක් තනවා ඒ තුළ තමන් තැන වූ ප්‍රතිමාව තැන්පත් කිරීමේ කාරිය දැයි සැක ඉපැදවීමට බැරි කමක් ද නැත. මේ අනුව සමනොළ කන්දේ සමන් දේවාලය පොළොන්නරු යුගයේ හෝ දඹදෙණි යුගයේ තනවන ලද බව අනුමාන කළ හැකි ය. එහෙත් පොළොන්නරු යුගයේදී සමන් දේව වන්දනය ප්‍රචලිත වී තිබුණු බවට සාධක බහුල ලෙස නො මැති බැවින් ද දඹදෙණි යුගයේ එය බහුලව පැවැති බවට සාධක තිබෙන බැවින් ද රාජාවලී පාඨය කෙරෙහි

1 රාජා. 202 පිටුව.
2 පූජා.-ඊ. තෙ. සංස්. 810 පිටුව.

විශ්වාසය තැබිය හැක්කේ තව දුරටත් කරුණු ස්ඵුට කිරීමෙන් පමණතැයි සඳහන් කළ හැකි ය.*

සමනොළ කන්දේ සිරි පා සටහන හා ඒ අවට පරිසරය ගැන ද විවිධ විස්තර සපයන විදේශීය ලේඛකයන් පවා සිටි-පතුල වසා තිබූ පැගෝඩාවක් වැනි ගොඩනැගිල්ලක් තිබූ බව පවසතත් ඔවුහු සමන් දේවාලයක් ගැන කිසිවක් නො කියති.[1] පුද පූජා පවත්වන මඩුවක් සමනොළ කන්දේ ඇතැයි එමර්සන් ටෙනන්ට් පවසයි.[2] ඒ මේ යටින් දේවාලය විය හැකි ය,

පැල්මඩුල්ලේ ගලපොත්තාවෙල පන්සලේ තබා තිබෙන සමන් දේව රූපය ඇතුළු පූජා වස්තු මේ සමන් දේවාලයේ සමසක කාලය තුළ තැන්පත් කර තබා වැඳුම් පිදුම් කිරීමට ඉඩ සලසා දී තිබේ. උඳුවප් පෝය දිනෙන් ඇරඹෙන සිරි පා වන්දනා සමයේ පමණක් මේ දේවාලයේ වතාවත් සිදු කිරීම විශේෂතාවකි. ඒ කාලය තුළ කෙම්මුර දිනවල විශේෂ වතාවත් සිදු කරනු ලැබේ. (බදාද හා සෙනසුරාද කෙම්මුර දින සේ සැලැකේ) මේ සඳහා එකී සමය තුළ සිරි පා කඳු මුදුනේ කපු මහතෙක් ද නේවාසිකව සිටී.

පැල්මඩුල්ලේ ගල්පොත්තාවෙල පුරාණ රජමහ විහාරයේ දේව කුටියක තැන්පත් කැර තැබෙන සමන් දේව ප්‍රතිමාව ඇතුළු පූජාවස්තු උඳුවප් පසළොස්වක් පෝය දිනට පෙර දින සමන්කුළ මුදුනට වැඩම කරවන්නේ චිරාගත චාරිත්‍රානුකූලව ය. එය ශ්‍රී පාදස්ථානයේ නායක ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වය හා අනුශාසනා ඇති ව සිදු කැරෙයි. සඳුන් දැව-යෙන් තනවන ලද අඩියක් පමණ උස සමන් දෙව් පිළිරුව මෙහි තිබෙන ඉතා අගනා පූජා වස්තුව වෙයි. එය කලින් ද සඳහන් කළ දේවප්‍රතිරාජා ඇමතිතුමා විසින් තනාවන ලද

---

* පොළොන්නරු යුගයේදී ශ්‍රී පාද වන්දනාව බෙහෙවින් ප්‍රචලිත වූ බවට සාධක බහුලය. විජයබා, නිශ්ශංකමල්ල රජවරුන්ගේ සෙල් ලිපි බලන්න.

1 Ceylon - Henry Marshal - Tisara Dehiwela (e) 172

2 Cey– Page 140

ප්‍රතිමාව යයි සිතන්නට පුළුවන. පූජාවලියේ දී තිබෙන සාධක හා සසඳා බලන විට මේ ප්‍රතිමාව එය ම යැයි නිගමනය කිරීම අසීරු නොවේ. ඒ බව පූජාවලියේ සඳහන් වන්නේ මෙසේ ය.

"... හෙතෙම පළමුව ගම්පළ නුවර ගොස් සමන් දෙවි රජාණන්ගේ රූපය කරවා රන් රුවන් පළඳනාවෙන් ජීවමාන රූපයක් සේ සාදා රුවන් මඩුයෙකින් ගෙන පූජා පෙරහරින් සමනොළ නික්ම..."

ගල්පොත්තාවෙල පන්සලේ සිට සමන්කුළ මුදුනට වැඩම කරවන සමන් දේවරූපයට රන් ආභරණ රාශියක් පළඳවා තිබේ. ඒවා කිසිවිටෙකත් ගලවා දේවරූපයෙන් ඉවතට ගනු නො ලැබේ. සුබ නැකතින් බුහුමන් ඇතිව ප්‍රතිමාව එළියට ගෙන පුද පූජා පවත්වා ස්තෝත්‍ර ගයා සුදු පිරුවටවල ඔතා පෙරහරින් සමන් කුළ කරා වැඩම කැරවීම සිරිතය. මේ පෙරහර ශ්‍රී පාදස්ථානයට යෑමට පෙර රත්නපුරයට පැමිණ එහි සමන් දේවාලයට පිවිස ටික වේලවක් සමන් දේව ප්‍රතිමාව ඇතුළු පූජා වස්තු එහි තැන්පත් කැර පූජා පවත්වා සමන් දෙවියන්ට පින් දී යෑම චාරිත්‍ර වශයෙන් සිදු වන්නකි.

නල්ලතන්නියේ සිට මේ පූජා වස්තු රැගෙන යන්නේ ඔසොවා ගෙන ය. ඒ යන අතර සීත ගඟුලේදී පිරිත් කියා පන්සිල් සමාදන් ව සමන් දෙවියන්ට පින් දීමත් දේව රූපය ශුද්ධ ජලයෙන් නැවීමත් චිරාගත චාරිත්‍රයකි. සමන්කුළෙහි දෙව් මැදුරේ දේවප්‍රතිමාව තැන්පත් කරනු ලබන්නේ ද ශුභ මුහුර්තයකට අනුකූලව ය. උඳුවප් පුර පසළොස්වක පෝය ද සිට වෙසක් පෝය දිනය තෙක් මේ සමන් දේව ප්‍රතිමාව පුද පූජා සඳහා සමනොළ කන්දේ තැන්පත් ව තිබේ. වෙසක් පුර පසළොස්වක් දිනයෙහි සිරිපා වන්දනාව අවසන් වනවාත් සමඟ ම යළිත් නැකත් බලා ඒ අනුව සමන් දෙව් පිළිරුව ගල්පොත්තාවෙල පන්සලට වැඩම කරවා ගෙන අවුත් දේව කුටියෙහි තැන්පත් කැර තබනු ලැබේ.

මේ ප්‍රතිමාවේ තිබෙන විශේෂතාව නම් ඉතාපිත් ප්‍රසන්න මුහුණකින් එය සමන්විත වීම ය. මෙ දේවරූපයට වාහනයක් නොමැති ය. දෙපයින් සිටගෙන සිටින ලෙස මෙය නිර්මාණය කැර තිබේ. ප්‍රතිමාවේ කුඩා බවත් බුහුටි බවත් කැපී පෙනෙන විශේෂ ලක්‍ෂණ ය. දේවප්‍රතිරාජයන් මෙය කුඩාවට තනාවන්නට ඇත්තේ සමන්කුළ කරා ඔසවා ගෙන යැමේ පහසුව සලකා ගෙන විය යුතු ය. ශ්‍රී පාද වන්දනාවෙන් පසු ව මෑතක් වන තුරු මෙය අවුරුදු පතා තැන්පත් කරන ලද්දේ පලාබද්ගල කිර්ති ශ්‍රී රාජ මහා විහාරයේ ය. එය ගල්පොත්තාවෙල විහාරස්ථානයට රැගෙන යැමේ තීරණය වර්තමාන ශ්‍රී පාදස්ථානාධිපතින් වහන්සේ විසින් ගන්නා ලද්දකි. ඊට ප්‍රධාන වශයෙන් හේතු වී තිබෙන්නේ පලාබත්ගල සිට මෙ පිළිමය ඇතුළු පූජා වස්තු සමනොළ කන්දට රැගෙන ගිය කම්කරුවන් විසින් අධික ගාස්තුවක් ඉල්ලා සිටීම බව අපට දැන ගන්නට ලැබිණි.

සබරගමු මහ සමන් දේවාලය.

කළු ගං මිටියාවතේ රත්නපුර - පාණදුර මහා මාර්ගයේ රත්නපුර නගරයට සැතපුමක් පමණ දුරින් සබරගමු මහ සමන් දේවාලය පිහිටා තිබේ. පෞරාණික ගොඩනැගිල්ලක් වන මෙය ඉතා මහල් මන්දිරයකි. උස් ගොඩැල්ලක් මත පිහිටි සමන් දේවාලයට පිවිසීමට දීර්ඝ පියගැට පෙළක් තිබේ. එහි එක් පසෙක බුදු මැඳුරක් ද වෙයි. පඩි පෙළ නැඟ යන විට හමු වන ශාන්ති මණ්ඩපය නමැති ශාලාව කෙළවර දේව මන්දිරය පිහිටියේ ය. ශාන්ති මණ්ඩපයේ බිත්තියෙහි සමන් දේවාල සෙල්ලිපියෙහි කැබැලි දෙකක් සවිකැර තිබෙනු පෙනේ. එහි ප්‍රධාන දොරටුව දෙ පස ශිව වටුක රාක්ෂසයන් දෙ දෙනකුගේ රූප ඇඳ තිබේ. තවත් පැරණි බිතු සිතුවම් කිහිපයක් ද දැක්ක හැකි ය.

සබරගමු සමන් දේවාලය තනවන ලද්දේ දඹදෙණියේ රජ කළ කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත රජුගේ අමාත්‍යවරයකු වූ ආර්ය කාම දේවයන් විසින් බව සමන් සිරිත

නාම කාව්‍ය ග්‍රන්ථයේ සඳහන් වෙයි. මෙහි සඳහන් අන්දමට සමන් දේවාලය තැනවීම පිළිබඳ සිද්ධිය මෙසේ ය.

ආර්යකාම දේව ඇමැතිතුමා සේවක පිරිසක් ද රැගෙන රත්නපුරයේ මැණික් ගැරීමට පැමිණියේ ය. තමන් හාරන ආකරවලින් වටිනා මැණික් ලැබුණොත් සමන් දෙවිඳුන්ට තෙමහල් මැඳුරක් තනා දෙන බවට හෙතෙම බාරයක් වූයේ ය. ආර්යකාමදේවයන් අපේක්ෂා කළ පරිදි ම අගනා මැණික් මතු වූයේ ලු. ඔහු ඒ බව දඹදෙණියේ රජුට පැවසූ කළ දේවාලය තැනවීමට රජුගේ අනුග්‍රහය ද ලබා දුන්නේ ලු. මේ අනුව සබරගමු මහ සමන් දේවාලය තනවන ලද්දේ ක්‍රි. ව. 1236 – 1270 අතර කාලය තුළ බව තීරණය කළ හැකි ය. දේවාලය තැනවීම පිළිබඳ විස්තර සමන් සිරිතෙහි සඳහන් වන්නේ මෙසේ ය.

දඹදෙණි පුරෙන් සො ද
පඬි පැරකුම් නිරිඳු ස ද
රජ සිරි විඳින ස ද
පවර රුදු රුපු රජුන් ඔද බි ද

මෙ නිරිඳු හට පව ර
මිණි කම් පිණිස මහත ර
සත් සියයක් විත ර
රැගෙන ඇරවුත් සිටිති වැර ශ ර

කිම දෙව්* නමින් යු ත්
ඇර සමුනෙක් බලාග ත්
නව යෙවුනෙහි අවු ත්
සුමන දෙවිඳුට පුද පුදව ත්

සූරිඳුනි සිරිබ ර
අප මිනිකම කරනව ර
ලැදුවොත් මිනි පව ර
ගෙයක් කරවමි තුන් මහල් ක ර

---

* කාමදේව

යැද ගෙන මේ ලෙ ලෙස්
මිනි කම් කරන දව සේ
අළවණ ටිනි ර යේ
දුටිම් සත් රුවන් සද සේ

සමගින් මෙදේ ගි
තුටුව පර දේ ගි
සත්‍යක් පමා ගි
කලෙන් සිතු ලෙසට නිරෝ හි

තම සදහන් ලෙස දෙ
නිසි මිනි දකපු විලස දෙ
සූරිඳුගෙ යස තෙද දෙ
අසුන් ලියවා අති ලෙසට සො දෙ

අැර දඹදෙණි පුර ට
පඩි පෙරකුම් නිරිඳු හ ට
දැන්වූ සද සගතු ට
වෙමින් මෙසුමිත යුරිඳු ට

පෙර යැද ගත් ලෙ ලෙස්
කරවන ලෙසට නො ල සේ
නරනිඳු සහ තො සේ
කිවෙන් මෙමෙහෙවර එසඳ දව සේ

යටි මළුයෙහි විස ල්
කරවා පාය තෙමහ ල්
බබලන සෙ ඇම ක ල්
තබා රන් කොත් මුදුන ඇමක ල්[1]

---

1 **සමන් සිරිත:** මෙය පුස්කොළ පොතකි. ජාතික කෞතුකාගාරයේ 1-42727-12 යනුවෙන් ලේඛනගත කැර ඇත. භාෂා ශෛලිය අනුව පෙනෙන්නේ මෙය නුවර කලයට අයත් වන්නක් බවය. ආචාර්ය පී. ඊ. පී. දැරණියගල මහතා විසින් මෙය තමන් විසින් සංස්කරණය කරන ලද දේව වර්ණනා කාව්‍යයට ඇතුළත් කොට තිබේ. සමන් දෙවියන් පිළිබඳ දීර්ඝ විස්තරයක් මෙහි අන්තර්ගත ය. ජනශ්‍රැති හැරුණු කොට සමන් දෙවියන් පිළිබඳ දන්නා ලැබෙන ඓතිහාසික මූලාශ්‍ර අතර මෙ තරම් අගනා එකක් කෘතියක් හෝ වෙනෙක් දක්නට ලැබී නැත. මේ ග්‍රන්ථය රචනා වූ සමයේදී සමන් දේව ඇදහිල්ල ඉතාමත් ප්‍රචලිත වූ බව විශ්වාස කරන්නට පුළුවන. රචකය ගේ අවධානය ඒ සඳහා යොමු වන්නට ඇත්තේ එබැවිනි.

තම සිතැඟි ඉටු කැර දීම නිසා තමන් වූ බාරය ඔප්පු කිරීමට කාමදේවයන් විසින් සමන් දෙවොල ගොඩ නඟන ලද බව මෙයින් කියැවෙයි. දොවොළ තනවා නිම කළ පසු ව ඒ බව රජුට දන් වූ රජ කළ එහි නඩත්තුවට ගම් බිම් ද පූජා කෙළේ ය. එහි ආවර්තේව සඳහා සේවක පිරිස්ද පත් කෙළේ ය.

ආර්ය කාම දේව ඇමැතිතුමා සමන් දේවාලය තැනවීමට පෙර සිට ම මෙහි විහාරස්ථානයක් පැවති බව සමන් සිරිතෙහි සඳහන් වි තිබේ. එසේ ම සවැනි පැරකුම්බා රජුගෙ සමන් දේවාල සෙල්ලිපියෙහි ද සංඝාවාසයක්, පුස්තකාලයක්, ප්‍රතිමා ගෘහයක්, චෛත්‍යයක් හා බෝධියක් ද වූ බව සඳහන් වෙයි. අලගියවන්න මුකවැටිතුමා ලියූ සැවුල් සන්දේශයෙහි සඳහන් වන තොරතුරුවලින් හෙළි වන්නේ ද සමන් දේවාලය සමීප යෙහි ද ගබක්, ඔත් පිළිමයක් හා බෝධි ධ්‍රැමයක් ද පැවති බව ය.1

එහෙත් වර්තමාන සමන් දේවාලය ආශ්‍රිතව දැන් දක්නට ලැබෙන්නේ බෝධි ධ්‍රැමයක් පමණය. එය ද පැරැණි ම බෝධිය දැයි කිව නො හැකි ය. පන්සලක් හා දගබක් දැන් එහි දක්නට නැත. ඒ සිද්ධස්ථාන පෘතුගීසීන් අතින් විනාශ වී ගොස් ඇති බව දැන ගන්නට තිබේ. වර්තමානයේ දක්නා ලැබෙන්නේ පෘතුගීසීන්ගේ බලකොටුව මත ඉදි කරවන ලද අභිනව සමන් දෙවොලයි. ආර්යකාමදේවයන් තැන වූ සමන්, දේවාලය පෘතුගීසීන් විසින් විනාශ කරනු ලැබ තිබේ.

ආර්ය කාමදේවයන් මෙහි පැමිණෙන විටත් සමන් වෙහෙරේ සමන් දේව ප්‍රතිමාවක් තිබුණු බව ද සමන් සිරි-තෙන් කියැවෙයි. එම සමන් දෙව් පිළිමය හමු වීම පිළිබඳ අද්භූතජනක කතා පුවතක් ද එහි අන්තර්ගත ය. කතාවට පසුබිම වී තිබෙන්නේ ශක වර්ෂ 1158 හෙවත් ක්‍රි. ව. 1236 යි. ඒ කතාව කෙටියෙන් මෙසේ ය.

සබරගමු විහාරයේ වැඩ සිටි සිවලංශ නැමැති හිමිපාණ කෙනෙක් වන්දනාකරුවන් ද කැටුව සිරිපා වන්දනාව උදෙසා සමනොළ නැංගා හ. ඒ පුර පසළොස්වක් දිනයකි. සිරිපදලස

---

1 සැවුල් සන්. 169 සිට 172 තෙක් කවි.

වැදි පුද්ගත් පිරිස පසෙක පසු වූහ. සීලවංශ හිමියෝ සෙසු සංඝයා වහන්සේ ද සමග පසෙක සැතපුණු හ. අරුණෝදයට මදක් පෙරාතුව මේ හිමියෝ සිනයක් දුට හ. ඒ සිහිනයෙන් උන් වහන්සේ දුටුවේ බමුණු වෙසක් මවා ගත් සමන් දෙවිඳු තමන් අමතන බව ය. එසේ සිහිනයෙන් පෙනී සිටි සමන් දෙවියෝ ''සදාට ම අපි තෙරිඳුන්ගේ වෙහෙරහි වැඩ සිටිමු හ'' යි සීලවංශ හිමියන්ට පැවසූ හ. තමන් දුටු සිනය පිළිබඳව කාරණා කාරණා විමසූ සීලවංශ හිමිපාණෝ සමනොළ කන්දේ වනය සිසාරමින් සෙනග යවා විපරම් කැර වූහ. එසේ වනයේ සැරි සරමින් සිටි මිනිස්සු සමන් දේව රූපය ගල් ලෙනක තිබෙනු දුට හ. මේ සමන් දෙව් රුව යහනාවක තැන්පත් කොට පංච තූර්ය නාදය සහිත පෙරහරකින් සමන් වෙහෙරට වැඩම කරවන ලදී. ඒ පෙරහර ශ්‍රී පාද ලාංඡනය ඇති තැනටත් ඉන් පසුව විවිධ ගම් පසු කොට රත්නපුරයටත් එතැනින් සපරපුරටත් පැමිණි බව සමන් සිරිතෙහි සඳහන් වේ. වර්තමානයේ සමන් දේවාලය පිහිටි ගම් ප්‍රදේශය එවක සපරපුර නමින් හැඳින් වුණු බව සමන සිරිතත් සැවුල් සන්දේශයක් දක්වන විස්තරවලින් ස්ඵුට වෙයි.

ආර්ය කාම දේව ඇමතියන් මැණික් ගරනු පිණිස රත්නපුරයට පැමිණ බාර වී එය ඔප්පු කරනු පිණිස තැනූ වූ අභිනව තෙම්හල් දෙව් මැඳුරේ තැන්පත් කරණ ලද්දේ සමන් වෙහෙරෙහි තබා තිබුණු පූර්වෝක්ත සමන් දේව ප්‍රතිමාව විය හැකි ය. නව දේවාලය නඩත්තුවට ඉඩම් හා ගම් බිම් පවරා දුන් පැරකුම් රජ එහි රාජකාරි සඳහා සුදුසු පිරිසක් ද පත් කළ බව ඒ රජුගේ සමන් දේවාල සන්නසේ ද සඳහන් වෙයි.

සමන් දේව ප්‍රතිමාව සීලවංශ හිමියන්ට හමු වූ අන්දම කියැවෙන සමන් සිරිතේ සඳහන් කතා පුවත ස්වභාවෝක්තිය ඉක්මවා යන - අතිශයෝක්තියට බර කතාවකි. සමන් දෙවියන් බමුණු වෙසක් මවා ගෙන සීලවංශ හිමියන් හමුවේ සිහිනයෙන් පෙනී සිටීමත් ගල් ලෙනක තිබූ සමන් දෙව් රුව ඔවුන්ට දකින්නට ලැබීමත් අතිශයින් ම විස්මය දනවයි. මෙය සමනොළ කන්දේ සිට දෙව්රුව වැඩම කැර වූ සිද්ධිය චමත්කාර කිරීමට රචකයා විසින් ගන්නා ලද උත්සාහයක් දෝ හෝ යි සැක සිතේ.

ආර්ය කාමදේවයන් තැනවූ මෙම දේවාලය කෝට්ටේ රජ කළ සවැනි පැරකුම්බා රජු දවස ද පැවැති බව ඒ රජුගේ සමන් දේවාල සෙල් ලිපියේ සඳහන් වේ. සවිසි දහසක ධනවාසයෙන් තමා මේ දේවාලය ප්‍රතිසංස්කරණය කැර වූ බව සවැනි පැරකුම්බා රජ මේ සෙල්පිලියේ සඳහන් කරයි. එහි එන,

> "ආර්යකාමදේව බ්‍රාහ්මනෝත්තමයානන්ට මුණුබුරු නීලපෙරුමාළුන්ට වදළ මෙහෙවරින් නව යොදුන් බද සපරගමුවෙහි සවිසි දහසක් ධන වියදම් කොට නටබුන් හරවා ප්‍රකෘතිමත් කොට ගෝපුර ද්වාර වීථි වින්‍යාස ඉඩම් කඩම් මඩම් ත්‍රෛභූමික ප්‍රාසාද දේව සිංහාසන හස්ත්‍යශ්වශාලා. . . . . , . . . ලක්ෂ්මීමත් වූ ලක්ෂමණ මහා දේවාලේ කරවූ බව" [1]

යන පාඨයන්ගෙන් ඒ බව සනාථ වෙයි. කෝට්ටේ යුගය වන විට සමන් දේවාලයේ කටයුතු භාරව සිටියේ නීලපෙරුමාල් නැමැත්තෙකු බව මෙයින් පැහැදිලි වෙයි. ඔහු සමන් දේවාලේ නිර්මාතෘ වූ ආර්යකාම දේව ඇමතිවරයාගේ මුණුබුරකු බවත් මෙයින් පැහැදිලි වෙයි. එසේ ම හෙතෙම බමුණු කුලයට අයත් වූවෙකි.

සවැනි පැරකුම්බා රජු දවස වන විට සමන් දේවාලය හඳුන්වනු පිණිස 'ලක්ෂමණ මහා දේවාලේ' යන නම භාවිත වී ඇති බව මෙයින් කියැවෙන අනෙක් වැදගත් කාරණයයි. එය දඹදෙණි සමයෙහි නො පැවැති සටහනකි. මේ නමින් සමන් දේවාලය හඳුන්වන්නට ප්‍රධාන හේතුව රාමායනයේ රාම රාවණ කතාව හා සම්බන්ධ ලක්ෂමණ, සමන් දෙවියන් සේ සලකන්නට ඇතැම් අය විසින් ගන්නා ලද උත්සාහයයි. කෝට්ටේ යුගය වන විට බමුණු බලපෑම ලක්දිව පෙදෙස්වල පැතිරී ගියේ ය. සමකාලීන සාහිත්‍ය කෘතීන්ගෙනුත් ග්‍රාමනාම ආදියෙනුත් ජනශ්‍රැතිවලිනුත් ඒ බව තහවුරු වෙයි.[2] සවැනි

---

1 Ceylon Antiquary – 1916 July 36.37 38 පිටු

2 බලන්න: ජන ජීවිතය ජනශ්‍රැතිය හා රයිගම - ඊ. ඇම්. රත්නපාල යන කෘතිය 47–154 පිටු

පැරකුම්බා රජු කල සමන් දේවාලයේ විධිමත් පරිපාලනයක් පැවැති බව පූර්වෝක්ත සෙල්ලිපියේ සඳහන් කරුණුවලින් පැහැදිලි වෙයි.

සීතාවක රාජසිංහ රජු ද සමන් දේවාලය ප්‍රතිසංස්කරණය කැර වූ බව සමන් දේවාල ලේකම් මිටියෙහි සඳහන් වන බව කිරිඇල්ලේ ඤාණවිමල හිමියෝ පවසති. සීතාවක රාජසිංහ රජුගෙන් පසුව රත්නපුරයට පැමිණි පෘතුගීසින්ගෙන් සමන් දේවාලයට සිදු වූයේ බරපතළ හානියකි. ක්‍රි. ව. 1601 වන විට සබරගමුවේ පෘතුගීසි බලය තහවුරු වී අවසන් විය.[1]

සමන් දේවාලයත්, සමන් වෙහෙරත්, පිරිවෙනත් විනාශ කළ පෘතුගීසීහු ඒ ස්ථානයෙහි ස්වකීය බලකොටුව තනා ගත් හ. වර්තමාන සමන් දේවාලය ඉදි කැර ඇත්තේ ඒ බල කොටුව මත ය. ඒ වායේ කිසියම් ධනයක් වී නම් ඒ සියල්ල ද පෘතුගීසීහු පැහැර ගත් හ.[2]

පෘතුගීසි ආක්‍රමණය නිසා මෙහි විහාරයේ විසූ භික්ෂූන් රක්ෂිත ස්ථාන කරා ඉවත් ව යන්නට ඇතැ යි සිතන්නට පුළු-වන. බෞද්ධ සිද්ධස්ථානය හා දේවාලය විනාශකළ පෘතුගී-සීන් එහි තම බලය තහවුරු කැර ගත් බව පළ කැරෙන පෘතු ගීසි සෙල් ලිපියක් ද සමන් දේවාලයෙහි දකින්නට තිබේ. සවැනි පැරකුම්බා රජු විසින් පිහිටුවන ලද සෙල්ලිපියේ කැබැලි පමණක් දක්නා ලැබෙන බව මෙහි ඉහතින් ද සඳහන් කරන ලදී. එම සෙල්ලිපිය පෘතුගීසීන් විසින් කඩා දමනු ලැබ දේවාලය අසල ගඟේ තොටුපොළෙහි ගිල්ලවා ඇතැයි ද අසන්නට ලැබේ.[3] සමන් දේවාලයට ඇතුළු වන ප්‍රධාන පිය ගැට පෙළෙහි දකුණු පැත්තේ බිත්තියට සවි කොට තිබෙන පෘතුගීසි සෙල්ලිපියේ ඉහළ කොටසෙහි කඩුවක් හා පළිහක් අමෝරා ගත් හේවායකුගේ හා ඔහුගේ පයින් පෑගී මැඩී සිටින තවත් සටන්කාමියකුගේ පිළිරුවක් දක්නට ලැබේ.

---

1 පරංගි කෝට්ටේ – විකිරි අබයසිංහ ලේක්හවුස් – කොළඹ (පාං) 19 පිටුව

2 Ceylon History in Stone – Raven Hart – Lake House (CHS) Page 114

3 –එම–

මේ කැටයම ඓතිහාසික වශයෙන් වැදගත් වන පුවතක් සටහන් කරන්නක් බව පෙනේ. මෙහි දර්ශනය වන්නේ ගෝමේස් නමැති පෘතුගීසි භට්වායකු බවත් ඔහුගේ පයින් පැගී වැටී සිටින්නේ පෘතුගීසීන්ට විරුද්ධ ව සටන් කළ කුරුවිට රාළ බවත් සිංහලයන් පවසති යි විලියම් ස්කින් පවසයි.[1]

පෘතුගීසි බසින් ලියැවී ඇති මේ සෙල් ලිපිය සමග ඇති මිනිස් රූ දෙක පිළිබඳව විස්තරයක් කරන කිරිඇල්ලේ ඤාණ විමල හිමියෝ මෙහි හේවායා විසින් පාගා මඩිනු ලබන තැනැත්තා කුරුවිට රාළ නොව සමන් දේවාලයේ ම ස්වර්ණාභරණ ගබඩාව භාරව සිටි රත්නක මුදියන්සේ බව අවධාරණයෙන් ම පවසති. ඔහු පෘතුගීසි පල්ලිය ද බිඳ දමා සිය ගණනක් පෘතුගීසීන් කපා දැමූ බවත් ඒ පිළිබඳ තල් පතක් තමන් වහන්සේට ලැබී ඇති බවත් ඤාණවිමල හිමියෝ පවසති.[2] එහෙත් එම තල්පතෙහි උධෘත පාඨ කිසිවක් උන්වහන්සේ ඉදිරිපත් නො කරති.*

උන් වහන්සේ සඳහන් කරන අන්දමට කඩුවත් පළිහත් අමෝරා ගෙන සිටින භට්වායා සිමන් පිං යෝ (Simao pinhao) නමැත්තා ය. පෘතුගාලයේදී වෙනත් පුරවැසියකුගේ මුහුණ කඩුවකින් කැපූ නිසා හෙතෙම පස් වසරකට බන්ධනාගාරගත විය. ඉන්පසු ඉන්දියාවේ නැවත සේවය කොට එහිදී ද කැඩුණු නැවක ධනය රැගෙන පලා ගොස් යළිත් බන්ධනාගාරගත විය. ඒ නිසා රටින් පිටුවහල් කරන ලද ඔහු එතැනින් ලංකාවට එවන්නට ඇතැයි කියනු ලැබේ. මෙරටට ආ හෙතෙම ජොරනිමෝ ද අසවේදු නම් කෲරතර පෘතුගීසි

---

1 Tomdstone and Monuments in Ceylon – J. Penry Lewis Colombo – Page 247–248

2 සබරගමුවේ පැරණි ලියවිලි – කිරිඇල්ලේ ඤාණවිමල හිමි (ස පැලි) 50 පිටුව

* මේ කැටයම පිළිබඳ දීර්ඝ සමාලෝචනයක් J. R. A S. (Ceylon) Vol xvi 1889 සඟරාවේ 84–92 පිටු අතර දක්නට ලැබේ. The Inscribe Mural Stone at the Mahasaman Devale, Ratnapura. D. W. Ferguson.

පාලකයා යටතේ සේවය කළ බවත් පසුව රාජකීය පවුලට අයත් දෝනා මාරියා පෙරේරා නම් කාන්තාවක ආවාහ කොට ගත් නිසා ඔහුට පෘතුගීසි හමුදාවේ නායකත්වය ලැබුණු බවත් බලනේදී හටගත් සිංහල පෘතුගීසි සටනේදී[1] වැනි විමලධර්ම සූරිය රජු මැරීමට කුමන්ත්‍රණය කළ බවත් ක්‍රි. ව. 1601 දී ඔහු ලිය ගිය බවත් සඳහන්ව තිබේ.[1] මේ හේවායා පිළිබඳව මෙයට සමාන විස්තරයක් Tombstones and Mnuments in Ceylon නමැති කෘතියෙහි ද සඳහන් ව තිබේ. ඒ විස්තරයේ මෙසේ සඳහන් වෙයි.

''පෘතුගාලයෙහි Punhete නමැති ගමෙහි වැසියකුගේ මුහුණ කපා දැමීම නිසා අවුරුදු පහක කාලයක් සඳහා ඔහු අ කාවට පිටුවහල් කොට පසුව ඉන්දියාවට යවන ලදි. එහිදී කොච්චිහි සිරගේ කඩා ගෙන පැන යෑමට තැත් කෙළේ ය. ලංකාවට එවන ලද්දේ ඊට දඬුවමක් වශයෙනි. ලංකාවට ආ ඔහු බටුගෙදර පෘතුගීසි බලකොටුවේ ආරක්ෂකයා බවට පත් විය. පසුව සබරගමුවේ සිංහලයන්ට විරුද්ධව අට සියක (8C0) ලස්කිරිඤ්ඤ හමුදවක් ද සමඟ කුරුවිට හා බටුගෙදර තම බලකොටු තර කැර ගත්තේ ය. කොනප්පු බණ්ඩාර හා ඔහුගේ පවුලේ සෙස්සන් ක්‍රිස්තියානියට හරවා ගැනීමට ඔහු සමත් වූ නිසා ඔහුගේ දූවක මේ හේවායාට සරණ පාවා දුන්නේ ය.[2]

පූර්වෝක්ත විස්තරයත් කිරිඇල්ලේ ඤාණවිමල හිමියන් දෙන විස්තරයත් බොහෝ දුරට සමාන නිසා අර කැටයම පිළිබඳව ඤාණවිමල හිමියන්ගේ මතය වඩාත් ශාස්ත්‍රීය වෙති යි සිතන්නට පුළුවන.

පෘතුගීසීන් විනාශ කළ සමන් දේවාලය ඔවුන්ගේ බල-කොටුව මත යළි ගොඩනංවන ලද්දේ දෙවැනි රාජසිංහ රජු විසිනි.* වර්තමානයෙහි දක්නා ලැබෙන්නේ එවක ඉදි කරවන ලද තෙමහල් මන්දිරයයි. ශාලාවේ කෙළවර උස් වේදිකාවක

---

1 සපැලි. 51 පිටුව
2 TMC page 247
* මේ බව පුස්කොළ පොතක සඳහන් වේ. අප විසින් එය පරීක්ෂා කරන ලදී. එහි පෙරහර පිළිබඳ තොරතුරු ද ඇතුළත් ය. එහි පිට පතක් රාජ්‍ය ලේඛනාගාරයේ ද තිබේ.

තැනුණු දේව කුටියට කිසිවකුට ඇතුළු වීමට කපු මහත්-වරුන්ගෙන් අවසර නො ලැබේ. එය තුළ දෙවියන්ගේ ආභරණ තැන්පත් කැර ඇතැ යි කියනු ලැබේ. එසේ ම දෙවියන් සංකේතවත් කරවන රියක් දේවාලය තුළ තබා ඇතැයි ද කියනු ලැබේ. සමන් දේවාලයේ වාර්ෂික ඇසල පෙරහරේ දෙවියන් වෙනුවට රැගෙන යන්නේ එම රියයි. දේවාලයේ කටයුතු පිණිස ජලය ලබා ගන්නා ගැඹුරු ළිඳක් ද මෙහි තිබේ. එහි ජලය භාවිතයට ගනු ලබන්නේ දෙවියන් උදෙසා ආහාර (මුරුතැන්) පිසීම පිණිස ය.

**සබරගමු මහ සමන් දේවාලයේ ඇසල උළෙල:-**

සමන් දේවාලයේ ඇසල උළෙල හුදෙක් දෙවියන් උදෙසා ම පැවැත්වෙන උත්සවයක සිරි ගනී. එය ආරම්භ වන්නේ සුබ නැකතකට අනුව කරනු ලබන "කප් සිටුවීම" නමැති චාරිත්‍ර විධි සිදු කිරිමත් සමග ය. කප් සිටුවීමෙන් පසු කුඹල් පෙරහර ද ඉක්බිති දෙවොලේ පෙරහර ද අවසානයේ මහ පෙරහර ද පැවැත්වේ. උළෙල අවසන් වන්නේ "දිය කැපීමෙනි".

කප් සිටුවීමේ සිට දිය කැපීම තෙක් සිදුවන චාරිත්‍ර හා ක්‍රියා-වලිය දෙස විමසුම් ඇසින් බලන විට ඒවා කෙරෙන් ද මානව විද්‍යාත්මක තොරතුරු සමූහයක් පිළිබිඹු වී පෙනෙන බව සඳහන් කළ හැකි ය. කප් සිටුවීමේදි කැරෙන්නේ මීටරයක් පමණ දිග රුක්අත්තන පොල්ලක් සුදු පිරුවටයක ඔතා ගෙන ගරුසරුඇති ව පෙරහරින් රැගෙන අවුත් ඒ සඳහා සකස් කැර ඇති සිදුරු සහිත ගලක නැකැත් වේලාවට සිටුවීම ය. සිටවනු ලබන මේ කප් ගසෙහි පොල් මලක් ද පොල් ගෙඩි දෙකක් ද බඳිනු ලැබේ. ඒ ක්‍රියාදමය දෙස බලන විට පෙනී යන්නේ එය ලිංගික ජීවිතය සංකේතවත් කරවන්නක් බව ය. සිදුරු කරන ලද සෙල්පුවරුවෙහි කප් ගස සිටුවීමත් අනතුරුව එහි පොල් ගෙඩි දෙකක් හා පොල් මලක් බැඳීමත් මේ කරුණ වැඩි දුර එත් තහවුරු කරවයි. මෙය සශ්‍රිකත්වය සංකේතවත් කිරීම අරභයා කරනු ලබන ක්‍රියාවක් සේ ද පෙනේ. කප් ගස සඳහා ගන්නේ රුක් අත්තන වැනි කිරි සහිත ලීයකි. සශ්‍රිකත්වය

සංකේතවත් කරනු පිණිස කඳුරු. රුක්අත්තන වැනි ලිඞ්ග භාවිත කිරීම අභිචාර විධි පවත්වන්නන්ගේ සිරිත ය. කප් ගස රැගෙන යන පෙරහරට කුඹලෙක් ද සහභාගී වෙයි. ඉනාතුව නවමු වළං කදක් රැගෙන යයි. කප් සිටුවීමෙන් පසුව පැවැත්වෙන කුඹල් පෙරහරෙහි මේ වළං කද රැගෙන යාම සිරිත ය. එයට කුඹල් පෙරහර යැයි කියනු ලබන්නේ ද එබැවිනි. කප්සිටුවීමත් මේ වළං රැගෙන යෑමත් අප ඉහත සඳහන් කළ අදහස් අතර සම්බන්ධතාවක් තිබේ. කප් සිටුවීමෙන් සංකේතවත් කැරෙන්නේ ලිංගික ජීවිතයේ අවස්ථාවකැයි ඉහත සඳහන් කෙළෙමු. එය අභිනව ජීවිතයක ආරම්භයයි. ඒ නව ජීවිතයට අවශ්‍ය නිවාස බඩු මුට්ටු ආදී බොහෝ දේ තිබේ. ඒ අතර නවමු වළං අත්‍යවශ්‍ය දෙයකි. කුඹලා වළං රැගෙන අවුත් නිරූපනය කරන්නේ නව ජීවිතය හා සම්බන්ධ අවශ්‍යතා හා වුවමනාකම් ගැන ය. දෙවේලේ පෙරහර හෙවත් වීදි පෙරහර ද දින පහක් දේවාලය වටා සැරිසරයි. මේ පෙරහරේ හස්තියකුගේ පිට මත යන කපු මහතා අපූරු පූජා වස්තුවක් සුදු පිරුවටයක ඔතා තම හිස මත තබා ගෙන සිටී. ඒ රීයක් යයි කියනු ලැබේ. මේ රීය මගින් නියෝජනය කැරෙන්නේ සමන් දෙවියන් ය.

සමන් දේවාලයේ ඇසළ උත්සවයේ උත්කර්ෂවත් ම අවස්ථාව මහ පෙරහරයි. මහ පෙරහරෙහි යන ඇතකු පිට ධාතු කරඬුවක් ද වැඩම කරනු ලැබේ. ඒ බෞද්ධ සංකේත යයි. කපු මහතා හා දේවාභරණ රැගෙන යන අපූරු රථයක් ද මේ පෙරහරේ යයි. එම රථයට සම්බන්ධ කැර ඇති වේවැලකින් මිනිස්සු දහ දොළොස් දෙනෙක් එය ඇද ගෙන යති. නැටුම් ගැයුම් සහිත මහ පෙරහර අවසානයේ මහා සංඝයා වහන්සේ පිරිත් සජ්ඣායනා කරති. අනතුරුව දානෙ කදක් සමන් දේවාලයෙන් පන්සලට යවනු ලැබේ.

මේ මහ පෙරහරෙහි ගෙන යන "මහබඹා" යන නමින් හැඳින්වෙන තවත් අපූරු නිර්මාණයක් වෙයි. උණ පතුරු හා බට ලී ආදියෙන් සැකිල්ල සදා ඇඳුමක් ද අන්දවා වෙස් මුහුණු දෙකක් දෙපැත්තට බැඳ සකස් කරන ලද මහ බඹාගේ එක් මුහුණක් පියකරු ය, අලංකාර ය. අනෙක් මුහුණ බියකරු ය,

ගොරසැඩි ය. එක් අතක් ඉණට තබා ගෙන අනෙක් අත ඔසවා කඩුවක් ද රැගෙන යන විලාසයක් මෙයින් පෙන්නුම් කැරේ. ඉණට තබා ගත් අතෙහි මල් මිටක් ද වෙයි. මෙයට "මහබඹා කෝලම" යයි ද කියනු ලැබේ. මහ බඹා කෝලම පෙරහරේ රැගෙන යනු ලබන්නේ ඒ තුළට රිංගා ගත් මිනිසකු විසිනි. කෝලම්වලින් බොහෝ විට සිදු කැරුණේ සැබෑ චරිතයක් ම වෛදිකාවේදී රඟ පෑමෙන් ප්‍රේක්ෂකයන්ට රසයක් ලබා දීම ය. ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ හා රයිගම් කෝරළයේත් කෝලම් නාටක අධ්‍යයනය කරන කල ඒ බව අපට පැහැදිලි විය.[1] මේ මහ බඹා කෝලම ද එවැනි චරිත නිරූපනයක් දැයි විමසිය යුතු ය. සීතාවක රාජසිංහ රජතුමාගේ චරිතය මේ මහබඹා කෙරෙන් නිරූපණය වන බව කිරිඇල්ලේ ඤාණවිමල හිමියෝ පවසති.[2] සමන් දේවාලයට වූ බමුණු බලපෑම් නිසා මහබඹා කෙරෙන් ද නිරූපණය වන්නේ එහි ලක්ෂණයක් යැයි මහාචාර්ය අබය ආර්යසිංහ මහතා පවසයි. මහ බඹාගේ ප්‍රසන්න මුහුණින් රාම සොහොයුරු ලක්ෂමණත් රුදුරු මුහුණින් රාවණ සොහොයුරු විභීෂණත් පෙන්නුම් කැරෙන බව ආර්යසිංහ මහතාගේ අදහස ය.[3] මහබඹා හුදෙක් පෙරහර නරඹන්නන්ගේ හාස්‍ය රසය උදෙසා මවන ලද කෝලමක් ම ලෙස උගතුන් කල්පනා කරන බව මේ අනුව අපට සිතන්නට පුළුවන. සමන් දේවාලයේ පෙරහර පවත්වනු ලබන්නේ සමන් දෙවියන් උදෙසා ය. එබැවින් පෙරහරේ රැගෙන යා යුත්තේ දෙවියන්ට සම්බන්ධ දේවල් ය. මිහිඳු පෙරහරෙහි මිහිඳු රූපයත් සංඝමිත්තා පෙරහරෙහි සංඝමිත්තා රූපයත් රැගෙන යන්නාක් මෙනි. සමන් දෙවියන් උදෙසා පැවැත්වෙන පෙරහරක වෙනත් අයගේ පිළිරූ රැගෙන යෑමේ අරුතක් ද නැත. එබැවින් මහබඹා කෙරෙන් විදහා දක්වෙන්නේ සමන් දෙවියන් ම දැයි සිතන්නට බැරි කමක් ද නැත.

දේවාලයේ මහ පෙරහර අවසන් වන්නේ දිය කැපීමෙනි. මේ දිය කැපීම කප් සිටුවීමෙන් අරඹන ලද එක්තරා සිද්ධි මාලාවක නිමාව සංකේතවත් කරවයි. දිය කැපීම සිදු වන්නේ

---

1 ස. ප. දැ, 99

2 දිනමිණ-(සමන් දෙවොලට ලක්ෂමණ වැඩුණු හැටි)-අබය ආර්යසිංහ

කඩු ගඟේ රත්මල් ඇල්ල නම් ස්ථානයේ ය. එය සමන් දේවාලයේ සිට සැතපුම් ගනක් පමණ දුරින් පිල්වල නැමුනු ගමේ පිහිටි වේගයෙන් ජලය ගලා යන ස්ථානයකි. අගුළු කීපයක් දිය කැපීමට යයි. එක් අගුලක් දේව අඟුල නම් වේයි. එහි දෙවියන්ට සම්බන්ධ දේ රැගෙන යනු ලැබේ. දෝලාවක් හා ඒ තුළ තබන වෙනත් දේව භාණ්ඩ එහි ගෙන යන දේවල් ය. මෙහි කපු මහතාත්, හේනෙ මාමා කෙනකුත්, ආලත්ති අම්මලාත්, විදනේ කෙනකුත් ගමන් කරති. මේ දේව අඟුල තද රතු පැහැති අල්ලි සහිත රෙද්දකින් සරසා තිබේ. දිය කැපීමට යන අනෙක් අගුල තූර්ය වාදකයන් බෙර, හේවිසි, හොරණෑ ආදිය වයමින් ගඟ දිගේ යන බෙර අගුලයි. මේ අඟුල් රත්මල් ඇල්ලට ළඟා වූ කල දේව අඟුල රත්මල් ඇල්ලේ යා හැකි උපරිම දුරට ම ගොස් කඹවලින් ගැට ගසනු ලැබේ. දිය කැපීම සිදු කැරෙන්නේ මේ අඟුලේ සිට ගෙන ය. එය කිසිවකුට දකින්නට ඉඩ නොදී රහසේ ම කරන කට-යුත්තකි.

දිය කැපීමේදී සිදු කැරෙන දේ පිටතට පෙනෙනු වලක්වනු පිණිස හේනෙ මාමා අඟුල වටා පිරුවටයක් ඇද එය ආවරණය කරයි. ටික වේලාවකින් රතු-සුදු පැහැති මල් ජලයේ පා වී යනු පෙනේ. අනතුරු ව අඟුල වැල්ලට ගත් පසු හේනේමාමා අගුලේ ලැල්ල මතට පිරුවටයක් දමයි. ඒ අවස්ථාවේ එතැනට පැමිණෙන බස්නායක නිලමේ ඒ මත පඬුරු වශයෙන් මුදලක් තැන්පත් කරයි. ඉන් අනුව බැතිමත්හුද පඬුරු පූජා කරති. මේ ක්‍රියාවලියත් මංගල චාරිත්‍ර වාරිත්‍රත් අතර ඉතා කිට්ටු සම්බන්ධතාවක් පවතින බව පැහැදිලි ය. දිය කැපීමට යනු අය අතර ආලත්ති අම්මලා, හේනෙ මාමා වැනි අය සිටීමත් ඔවුන් අතර පවතින රහස් සෙස්සන්ට හෙළි නොකිරීමත් ආදී සිරිත් ද රතු පැහැය මේ අවස්ථාවේදී වැඩි වශයෙන් භාවිතයට ගැනීම ද මංගල්‍යකදී මෙන් කැමෙන් බීමෙන් මේ අවස්ථාවේදී සංග්‍රහ කිරීම ද යනාදී හැම කටයුත්තක් ම ළං වන්නේ මංගල චාරිත්‍ර හා මංගල කටයුතුවලට ය. එබැවින් දිය කැපීමේ උළෙළින් ප්‍රකාශ කැරෙන්නේ ලිංගික ජීවිතයේ සිද්ධි මාලාවක එක්තරා සමාප්තියක් හුවා දක්වීම බව පැවසිය හැකි ය. සාමාන්‍ය

මංගල චාරිත්‍ර හා සමඟ මේ දිය කැපීමේ බොහෝ සිරිත් එකිනෙක ගැලපෙන නිසා මේ නිගමනයට එළඹීමට පහසු ය.

සමන් දෙවියන් උදෙසා පමණක් නොව වෙනත් දෙවිවරුන් උදෙසා ද දිය කැපීමේ උත්සව පැවැත්වීම සිරිතය. එහෙත් දිය කැපීමක් සිදු කරනු ලබන්නේ බිසොවක සිටින දෙවිවරුන්ට පමණක් වීම විශේෂයෙන් සඳහන් කළ යුතු සිද්ධියකි.[1] සෙසු දෙවිවරුන් සඳහා පැවැත්වෙන්නේ නානුමුර මංගල්‍යය නමින් හැඳින්වෙන ක්‍රියාවලියකි. සමන් දෙවියන්ට බිසොවක හා දරුවකු සිටි බව සැවුල් සන්දේශයෙහිත් සමන් දේවාල සෙල් ලිපියෙහිත් සඳහන් වේ. එබැවින් හුදෙක් ලිංගික ජීවිතයේ එක්තරා අවස්ථාවක් නිරූපණය කිරීම උදෙසා පැවැත්වෙන උත්සවයක් ලෙස මේ දිය කැපීම හඳුන්වා දීමට මෙය ප්‍රබල සාධකයක් වෙයි. කප් සිටුවීමත් දිය කැපීමත් අතර පවත්නා මේ චර්යා රටාව එකිනෙකට සම්බන්ධ බව මෙයින් පැහැදිලි වෙයි.

මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ එක් මතයක් වන්නේ මේ පෙරහර සමන්තභද්‍ර බෝධිසත්වයන් උදෙසා පැවැත්වෙන බව ය.[2] එහෙත් සබරගමු මහ සමන් දේවාලය සමන්ත භද්‍ර බෝසතුන් උදෙසා කැප වූවකැ යි පිළිගැනෙන සාධක කිසිවක් අප දන්නා තරමින් නම් සොයා ගත නොහැකි ය.

### මහියංගණයේ අලුත්නුවර සමන් දේවාලය.

මහියංගනයේ විහාර භූමියේ ම එහි චෛත්‍යය අසල මේ සමන් දේවාලය පිහිටුවා තිබේ. මෙහි ආරම්භක යුගය ගැන තොරතුරු සපයා ගැනීම අපහසු වුවත් ඉත

---

1 දිනමිණ 1990. 07. 14 අලුත්නුවර දැඩිමුණ්ඩ දෙවියෝ නැමැති ලිපිය – ධර්මසිරි සේනානායක. එහි මෙසේ දැක්වේ.
'කප් සිටුවීමක් කරනු නොලබන්නේ දියකැපුමක් නැති හෙයිනි. දිය කැපුමක් කරනු නොලබන්නේ අලුත්නුවර දෙවියන්ට බිසෝ කෙනෙක් නොසිටි නිසාය...''

2 ලක්දිවට මහායාන අදහස් නැමැති ලිපිය. පුරාණ යුගය. තිසර ප්‍රකාශන. 200 පිටුව.

පැරැණි දේවස්ථානයක් බවට සැකයක් නැත. මෙහි ගොඩ-නැගිලි ද වරින් වර ප්‍රතිසංස්කරණයට භාජනය වී තිබෙන නිසා ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ අතින් ද එහි පෞරාණි-කත්වය පිළිබඳ නිගමනයකට එළඹීමට අපහසු ය. එහෙත් බුදුන් වහන්සේ ජීවමාන කාලයේ සිට ම සමන් දෙවියන් පිළිබඳ පුවත් අපේ ජන සමාජයේ පැවැති බව මූලාශ්‍රයන්ගෙන් කියැවෙන නිසා මේ දේවාලය ඉතා පැරැණි එකක් බව පිළි-ගැනීමට අපහසු නැත.

ලංකාවේ අන් සමන් දේවාලයකදී දක්නා නොලැබෙන විශේෂතා කිහිපයක් මහියංගණ සමන් දේවාලයේදී දක්නට පුළුවන. සමන් දෙවියන්ගේ අක්කා ලෙස සැලැකෙන ''මහලොකු'' නමැති දේවතාවියකට ද මේ සමන් දේවාලයේ-දීම වැඳුම් පිදුම් කිරීම ඉන් එක් ලක්ෂණයකි. අප දන්නා තරමින් සිය සහෝදරිය සමඟ එක ම දේවාලයකදී එකට වැඳුම් පිදුම් ලබන එක ම දේවතාවා වන්නේ ද සමන් දෙවියන් ය. මෙහි තිබෙන අනෙක් විශේෂතාව නම් සමන් දෙවියන්ටත් වඩා මේ ''මහලොකු'' බලසම්පන්න දේවතා-වියකැ යි පොදු ජනතාව විසින් පිළිගනු ලැබීම ය. මෙම දේවතාවියට පුද පූජා පවත්වන විට ඒ සමඟ ඇයගේ සේවිකා-වකට ගෞරව සත්කාර කිරීම ද සිරිතකි. එහෙත් පොදු ජනතාව තුළ වැඩි වශයෙන් ම සැලැකිල්ලක් තිබෙන්නේ සමන් දෙවියනුත් මහ ලොකුත් කෙරෙහි බව දකින්නටත් අසන්නටත් ලැබිණි.

මහලොකුටත් සමන් දෙවියන්ටත් භාර හාර වීමෙනුත් විවිධ පිංකම් කොට තමන් ලබා ගන්නා පින් ඔවුන්ට පැවිණ-වීමෙනුත් සෙත් ශාන්ති ලැබෙන බව මේ ප්‍රදේශවාසීන්ගේ ජන විශ්වාසයයි. පෙර සඳහන් කළාක් මෙන් මහලොකු සමන් දෙවියන්ටත් වඩා බලවත් නිසා ඇයගෙන් පිහිටක් ලැබෙන බවත් ඔවුහු දැඩි ලෙස විශ්වාස කරති.

තමන්ට බෝවන රෝගයක් වැළැඳී කලෙක එය ''දෙවියන්ගේ ලෙඩකැ''යි සලකන බොහෝ දෙනා සමන් දේවාලයට පැමිණ එය සමනය කැර දෙන ලෙසත් එය

තවකකුට බෝවීන්නට ඉඩ නොදී වළක්වන ලෙසත් මහලොකුගෙන් ඉල්ලා සිටිති. දරුවන්ගේ අධ්‍යාපනය සාර්ථක කැර ගැනීම, මනසට වධ දෙන විවිධ මානසික ප්‍රශ්නවලට සහනය ප්‍රාර්ථනා කිරීම වැනි වුවමනාවන් සපුරා ගැනීමට මහලොකුටත් සමන් දෙවියන්ටත් බාර වීම මහියංගණ ප්‍රදේශයේ ජනතාවගේ සිරිත ය. දරු සම්පත් අපේක්ෂාවෙන් සිට ඒ ඉටු නොවන කලෙක තමාට දරු සම්පතක් ලැබ දෙන ලෙස ඉල්ලා මහලොකු අක්කාට බාරවීම බින්තැන්න පෙදෙසේ පවත්නා තවත් චාරිත්‍රයකි. ගොවියෝ තම ගොවිපළ වන සතුන් ආදීන්ගෙන් ආරක්ෂා කැර දී වැඩි වැඩියෙන් අහුපැවත ලබා දෙන ලෙස සමන් දෙවියන්ගෙනුත් මහලොකුගෙනුත් ඉල්ලා සිටිති. තම අපේක්ෂාවන් සඵල වූ කල යළිත් දේවාලයට පැමිණ තමන් බාරය ඔප්පු කිරීමට මේ ප්‍රදේශයේ ජනතාව අමතක නො කරති. මෙහි පොල් ගැසීමේ චාරිත්‍රය ද පවතී.

දඹාන, වටවන, සොරබොර ආදී පෙදෙස්වල වෙසෙන වැද්දෝ ද මහලොකුට හා සමන් දෙවියන්ට විශේෂ සත්කාර පවත්වති. තමන්ගේ ජීවිතයට බෙහෙවින් සම්බන්ධ දේවතාවන් ලෙස ඔවුහු මේ දෙදෙනාට වැඳුම් පිදුම් කරත්. වැද්දන් විසින් අදහනු ලබන ඔවුන්ට ම ආවේනික වූ දේව සමූහයාට අමතර ව ඔවුන් සමන් දෙවියන් හා මහ ලොකු මෙසේ ඇදහීම අතීතයේ සිට ම පැවත ආ චාරිත්‍රයකි. මහියංගණයේ වැදි පෙරහර පැවැත්වෙන්නේත් මේ සමන් දේවාලය ආශ්‍රය කොට ගෙන ය. මහලොකු සමන්, දෙවියන්ටත් වඩා බලවත් වුවත් ඇය තමන්ට මවක මෙන් වැදගත් බවත් තලාවරිගෙ සුදුබණ්ඩියා අපට පැවසූයේ ය. (එය ඔහුගේ බසින් ම කියතොත් මෙසේ ය. **මහලොකු ඇත්තෝ මේ ඇත්තන්ට අම්මිලැත්තො වගෙ)**

**සමන් දෙවියන් සමඟ ඔවුන් ගේ සහෝදරිය ද වන්දනා** මානයට පත් වීමෙන් විශේෂත්වයට පැමිණි මහියංගණයේ **සමන් දෙවොල වැදි පෙරහර පැවැත්වීම නිසා ද විශේෂත්වයකට පත් ව තිබේ. ලක්දිව වැද්දන්ගේ පෙරහරක් පැවැත්වෙන එක ම දේවාලය ද මෙයයි. ඓතිහාසික වූත් සමාජ විද්‍යාත්මක**

වූත් අගයක් මේ වැදි පෙරහරින් ගම්‍යමාන වන බව පැවසීමට පුළුවන. තමන් යක්ෂ ගෝත්‍රිකයන් ලෙස හඳුන්වා දෙන වැද්දෝ, තමන් මේ පෙරහරින් පෙන්නුම් කරන්නේ බුදුන් වහන්සේ ලංකාවට වැඩම කළ අවස්ථාවේ යක්ෂයන් උන් වහන්සේට ඉඩ දීමට බැරි යැයි කියමින් සටනට පිවිසි ආකාරය යයි පවසති. වැද්දන් පෙරහරෙහි යන්නේ ඇඟෙහි මී පැණි ගා දූළු අලවා ගෙන කෝටු රැගෙන ඒවා දිගු කරමින් 'හූ' හඬ ද නංවමින් භයංකර විලාශයක් මවා පාමිනි. මුනිඳුන් අහසේ වැඩ සිටින විට යක්ෂයන් උන් වහන්සේ බිය කිරීමට පැමිණි අන්දම මේ පෙරහරින් පිළිබිඹු වන බව වැද්දෝ ප පවසති. බුදුන් වහන්සේ කිසිවකුට බිය ගැන්වීමට නො හැකි උත්තමයකු බව පැවසූ සුදුබණ්ඩයා තමන් වැදි පෙරහර පවත්වන්නේ ඒ අතීත සිද්ධිය සිහිපත් කිරීමට බවත් පැහැදිලි කෙළේ ය. මෙය චිරාගත ව පවත්වා ගෙන එනු ලබන චාරිත්‍රයකි. මේ වැදි පෙරහරෙහි සමාජ විද්‍යාත්මක හා මානව විද්‍යාත්මක වැදගත්කමක් පවතින බව අප විසින් පවසන ලද්දේ එබැවිනි. පුළුං ඇඟේ අලවා ගැනීමෙන් ද කෝටු උඩට හරවා අහස දෙසට දිගු කිරීමෙන්ද 'හූ' හඬ නැංවීමෙන් ද ඔවුන් කරන්නේ මුනිඳුන් බිය කිරීමට යකුන් කළ වැඩ ටික එ හැම පිටින් ම අනුකරණයෙන් රඟපෑමකි. මුළු මහත් බිත්තැන්-නට ම සතුරු උපද්‍රවයක් නැති ව ජීවත් වන්නට අවකාශ සලසා දෙන්නේ සමන් දෙවියනුත් මහඟලාකුත් බව මේ අන්දමට වැද්දෝ ඉතා දැඩි ලෙස විශ්වාස කරති.

මේ දේවාලයේ ද පෙරහර අවසන් වන්නේ මහවැලි ගඟේ රන් පුහුලාවල නමැති ස්ථානයේදී දිය කැපීමෙනි. එහිදී ද දිය කැපීමේදී කරනු ලබන කිසිවක් කිසිවකුට දකින්-නට ලැබෙන්නේ නැත.

**බොල්තුඹේ සමන් දේවාලය.**

බලංගොඩ – පින්නවල පාරේ සැතපුම් දහයක් (10) පමණ දුරින් පිහිටි ගම්මානයේ කඳු ගැටයක් මත මේ දේවාලය තනාවා තිබේ. ගෘහ නිර්මාණ ශිල්පය දෙස බලන විට මෙය ද රත්නපුරයේ මහ සමන් දේවාලයේ ස්වරූපයට බෙහෙවින්

සමාන බව පෙනේ. රාම - රාවණ යුද්ධය පදනම් කොට ගෙන අතීතයේදී ද මෙහි පැරණි දේවාලයක් තිබුණු බවට ජන විශ්වාසයක් පවතී.

රාම - රාවණ යුද්ධය මේ අසල සිදු වි යැයි කියැවෙන ජනශ්‍රැති රාශියක් මේ ප්‍රදේශයේදී අපට එක් රැස් කැර ගැනීමට ද හැකි විය. බොල්තුඹේ ගම් ප්‍රදේශය අසල පිහිටි දෙතනගල කඳු මුදුනේ සිට රාම රජ රාවණ රජුට දුන්නෙන් විද මරා දැමිය යි මේ ජනප්‍රවාද පවසයි. මේ කඳු මුදුන කාන්තාවකගේ පියයුරු යුග්මයකට සමාන නිසා ඊට දෙතනගල යන නම ව්‍යවහාරයේ පවතී. රාම - රාවණට විද්දේය යි කියන්නේ මේ කඳු මුදුන් දෙකට දෙ දණ තබා වෙර ඇර ගෙන ලු. සමන් දෙවියන් රාම සොහොයුරු ලක්ෂමණ ලෙස පසු කලෙක සලකන ලද්දේ මේ කතා පුවත් පදනම් කැර ගෙන ය.

සබරගමුවේ මහ සමන් දේවාලයට සතුරු ආක්‍රමණයක් එල්ල වුවහොත් එහි තිබෙන වටිනා දේ ආරක්ෂා කැර තබ ගනු පිණිස 1 වැනි රාජසිංහ රජු විසින් මේ සමන් දේවාලය තනවන ලද බව, මේ පිළිබඳ ඉතිහාසය විමසන විට අසන්නට ලැබේ. එවක තිබූ දේශපාලන වාතාවරණය අනුව මේ සැකය රජු තුළ ඇති වන්නට ඇත. ස්ථිර වශයෙන් ම එය සිදු විය. ඒ පිළිබඳ විස්තර මෙහි රත්නපුර සමන් දේවාලය පිළිබඳ ලියවුණු තොරතුරුවල ඇතුළත් කැරිණි. බොල්තුඹේ සමන් දේවාලයේ උළුවහු අලංකාර කරනු පිණිස ඇත්දත් කැටයම් යොදා ගෙන ඇත. දෙරටුවෙහි සඳකඩ පහණක් ද වෙයි. එය අපේ පැරණි සඳකඩ පහණවල මෙන් අපූරු කලා කුසලතා විදහා නො දක්වයි.

මේ දේවාලයෙහි ඇති භාණ්ඩ අතුරින් රාවණ රථය නමින් යුත් අද්භූත වස්තුවක් වෙයි. මෙය දේවාලයෙන් පිටතට ගත හොත් වැසි වසින්නට පටන් ගන්නා බවට විශ්වාසයක් තිබේ. රථයක් යැයි කිව ද මෙයට රෝද නැත. මෙය ලෝහවලින් තනවා ඇතැ යි කියනු ලැබේ. මෙය රාවණ රජුගේ 'දඬු මොණරය' සංකේතවත් කරන බව බොහෝ

දෙනාගේ විශ්වාසයයි. වරක් බොල්තුඹේට පැමිණි ඉංග්‍රීසි සිවිල් සේවකයෙක් මේ රථය ගැන අසා එය එළියට ගන්නා ලෙස ඉල්ලා සිටියේ ලු. එසේ කළ හොත් වැසි වසින්නට පටන් ගන්නා බව දේවාලයේ කපු මහත්වරු ඔහුට කීවෝ ලු. එය විශ්වාස නො කළ සිවිල් නිලධරයා එය ඉවතට ගන්නා ලෙස පෙරැත්ත කෙළේ ලු. ඒ අනුව රාවණ රථය දේවාලයෙන් ඉවතට ගත් කල මහ වැසි වසින්නට පටන් ගෙන ඔහුට ආපසු යෑමට පවා අසීරු වූයේ ලු. බොල්තුඹේ වෙල් යාය ද ගංවතුරෙන් යට වී අන්තිමේදී ඔහුට ආපසු යන්නට සිදු වූයේ හස්තියකුගේ පිට උඩින් බව මේ පිළිබඳ තොරතුරු දන්නා ගම් වාසීහු අපට පැවසූ හ. රාවණ කොඩිය නමින් දන්නා කොඩියක් ද මෙහි දේවාලයේ තිබේ. එය ද එළියට ගත් කළ වසිති යි ජන විශ්වාසයක් පවතී. මේ විශ්වාස නිසා බොල්තුඹේ සමන් දේවාලයේ තිබෙන බව පැවසෙන මේ භාණ්ඩ ගැන මනා පරීක්ෂාවක් කිරීමට අපට ඉඩ කඩ නො ලැබිණි. දේවාලය තුළට ඇතුළු වීමට ආගන්තුකයන්ට අවසර නොදීම ඊට ප්‍රධාන හේතුවයි.

රත්නපුර සමන් දේවාලයේ තිබූ භාණ්ඩ පරෙස්සමට මෙහි තැන්පත් කැර ඇතැ යි ගම් වැසියෝ ද පවසති. ඒ අතර දුනු හා ඊතල කිහිපයක් වෙතියි ද කියනු ලැබේ. මේ දුනු ඊතල රාම රාවණ යුද්ධය බළංගොඩ සිදු වූ බව පැවැසෙන ජනශ්‍රැති සනාථ කරන බව බොල්තුඹේ අසල ගැමියෙක් අපට පැවසූ හ. රාම රාවණ පුවත සනාථ කැරෙන පුරා විද්‍යාත්මක සාක්ෂි කිසිවක් නොමැති බවත් ඇත්තේ ජනකතා හා ග්‍රාම නාම ආදිය පමණක් බවත් මෙහි ලා සැලකිය යුතු ය.

රාවණ රථය හා රාවණ කොඩිය අතීතයේදී මෙහි තිබුණු බව පැවසෙන රාවණ දේවාලයේ අවශිෂ්ට වන්නට පුළුවන. වර්තමානයේ නම් රාවණ ඇදහිල්ලක් මෙහි ඇත්තේ ම නැති බව කිව යුතු ය. රත්නපුර සමන් දේවාලයේ මෙන් මෙහි ද වාර්ෂික ඇසල උළෙලක් පැවැත්වේ.

**දැරණියගල සමන් දේවාලය:-**

අවිස්සාවේල්ල - කෑගල්ල මහා මාර්ගයේ දෙහිඕවිටින් හැරී සැතපුම් 8 ක් පමණ යන කල හමු වන දැරණියගල නගරය

අසල කවාකාර කඳු ගැටයක් මත මේ දේවාලය පිහිටුවා තිබේ. දැනට නෝපළ වී ඇති එක්තරා පුස්කොළ පොත්ක සඳහන් වන අන්දමට පෙනී යන්නේ මේ දේවාලය දෙවැනි රාජසිංහ රජු විසින් ගොඩනංවනු ලැබ ඇති බව ය. ඒ ශක වර්ෂ 1508 දී ය. (ක්‍රි. ව. 1658) දේවාලය තැනවීම පිළිබඳ රසවත් කතා පුවතක් මේ පුස්කොළ පොතේ සඳහන් වෙයි. ඒ තොරතුරු ම මඳ වෙනස්කම් සහිතව ජනතාව අතරත් පවත්නා බව අපට පෙනිණි. දේවාලය ඉදි කිරීම පිළිබඳ කතාව මෙසේ ය.

එක් දවසක් රාජසිංහ රජුට සිනයක් පෙනිණ. ඒ සිනය තේරූ දෛවඥයන්ට පෙනුණේ දැන් සමන් දේවාලය පිහිටි ස්ථානය අසලින් ගලන ගඟ උඩුගං බලා යෑමට හේතුවක් ඇති වන බව ය. සමන්තකූට පර්වතයේන් එන රාම සැරයක් වැදී හොර ගයක් දෙපලු වීම නිසා ගඟ ඇහිරී යන බව ද ඔව්හු කීහ. රජු මේ සිනය දකින අවස්ථාවේ දූරණියගල සමන් දේවාලයක් තිබුණේ නැත. එ තැන එවක තිබුණේ කතෝලික පල්ලියකි. එහි සිටියේ ඕල් නමැති පූජකයෙකි. ''වස්තු හිමි රජා මම වෙමි'' යි පැවසූ එක්තරා කුමාරයෙක් (ඔහුට වත්හිමි කුමාරයා යයි ද කියනු ලැබේ.) ඕල් පාදිලි තැනගේ පල්ලියට පැමිණ එහි තිබූ රන් රිදී ආදී සියලු වස්තුව අයිති කැර ගෙන පල්ලිය තම මාළිගාව බවට පත් කැර ගත්තේ ය.

මේ අවස්ථාවේ දෙරණෑගල ගණිතයා නමැති දෛවඥයෙක් ශාස්ත්‍රයක් කීවේ ය. ඒ ශාස්ත්‍රයෙන් කියැවුණේ වස්තුව හිමි කැර ගෙන සිටියත්, වත්හිමි - කුමාරයාට වැඩි කලක් ඉන්නට නො ලැබෙන බවත් බෝ තොට නමැති තැන ඇති හොර ගස ශක වර්ෂ 1580 වෙසක් පුර පසළොස්වක් දා –බදුදුරු දෙළොස් වැනි පැයේදී කඩා වැටී ගඟ හරස් වී ගඟ පිරී ජලය ගලා මාළිගය යට වන බවත් ය. වස්තු හිමි රජුට මේ කතාව නිසා කේන්ති ගියේ ය. දෙරණෑගල ගණිතයා දඬු ගසා කබන්නට හෙතෙම නියම කෙළේ ය. මා දඬු ගසතොත් උඩු ගං කන්දේ මිස පහත් බිමක නම් එපා යැයි හෙතෙම දන්වා සිටියේ ය. රජ එසේ කෙළේ ය. ගණිතයා පැවසූ

වේලාවට ම බෝනොාවට හොර ගස ගහ හරහා කඩා වැටී ගහ ගලා මාලිගය යට වන්නට ආයේ ය. වික්‍රම රජ සිය බිසව ද සමග රාජුරුවාගලට පැන ගත්තේ ය. එහිදී හේ පොළහකු විසින් කනු ලැබුවේ ය. මේ සඳහා කැලෑ කොළ පොතු ආදියෙන් බෙහෙත් කරමින් හේ පැල්මඩුල්ල දෙසට ගමින් කෙළේ ය. එසේ යන අනතුර පැල්වාඩියේදී උණ ගැනිණි. එතැනින් නික්ම යන කල කුෂ්ටයක් ද මතු වී හෙතෙම මිය ගියේ ය. කුෂ්ටයක් නිසා රජු මිය ගිය මේ පෙදෙස කුෂ්ටපිටිය නමින් ප්‍රසිද්ධ විය. (දැන් ශ්‍රී පාදයේ නින්ද ගමක් වන කුට්ටා පිටියට ඒ නම ලැබුණේ මේ කාරණය නිසා ලු.)

ඉන් පසු දෙවැනි රාජසිංහ රජ මෙහි පැමිණ තොරතුරු විමසන කල පෙනී ගියේ සමන් දෙවියන්ට මේ ස්ථානය වුවමනා වී රාම සැරයක් එවා තේජස් පෙන්නා ස්ථානය ලබා ගන්නට ක්‍රියා කැර ඇති බව ය. එබැවින් රාජසිංහ රජ මෙහි දේවාලය තැනවීය. ඒ බව පූර්වෝක්ත පුස්කොළ පොතේ සඳහන් වන්නේ මෙසේ ය.

> "........ කෝරළ තුනේ දිසාව ඇතුළු බුලත්ගම් දිසාව ඇතුළු සපරගමු දිසාවේ කළු ගඟෙන් මෙගොඩ මෙකී රටවල්වල කුඩා මහත් අයවල් රැස් කරවා ශ්‍රී සුමන දෙවියන් වහන්සේට දේවාලේ කරවා වදාළ සේක" යනුවෙනි..

ඕල් නමැති පූජකයා සතු ව මෙහි පැවැති වස්තුව ඇල්පිටියේ වෙලේ පතහක් කැණ එහි වළලා සමන් දෙවියන් වෙනුවෙන් නිදන් කළ බව ද එහි සඳහන් වේ.

මේ පුස්කොළ පොතේ එන කතා පුවත අනුවත් දේවාලයේ කපු මහත්වරුන් කරන යාතිකා ආදියේ සඳහන් වන තොරතුරු අනුවත් පෙනී යන්නේ සමන් දෙවියන් රාම ගේ සොහොයුරු ලක්ෂමණ ලෙස ඔවුන් සලකන බව ය. රාම සැර*

---

* සැර – ශර යනු ඊතලයට භාවිත වන නමකි. රාමගේ ඊය යන තේරුමෙන් මෙසේ යෙදෙන බව පෙනේ. පෙරහැරෙහි ඊයක් රැගෙන යන්නේ ද එබැවින් විය යුතු ය.

යැවීම වැනි සිද්ධි ඊට නිදසුන් යැ කෝට්ටේ යුගයෙන් පසු ව මේ අදහස ව්‍යාප්ත වී ගොස් ඇති බව පෙනේ.

දැනට මේ දේවාලයේ පැරණි ගොඩනැගිලි කිසිවක් නැත. ඒවා කඩා දමා නව දේවාලයක් තනවා තිබේ. පැරණි ගල් කණු කැබැල්ලක් ද පඩියක් ද පිත්තල තැටියක් ද මෙහි ඇති අවශිෂ්ට ලෙස පෙන්නා දීමට පුළුවන. අනෙක් සියලු ම දෑ නවීකරණය කොට තිබේ. කප් සිටුවීමේ සිට දිය කැපීම තෙක් වන පූද පූජා සහිත ඇසල පෙරහරක් මෙහි ද පැවැත්වේ.

# 4

# සමන් දෙවියෝ කවරහුද?

සමනොළ කන්ද හා ඒ අවට පෙදෙස්වලට අධිපති දෙවියා ලෙස සැලකෙන සමන් දෙවියන් හඳුනා ගනු පිණිස උගතුන් විසින් විවිධාකාරයේ ප්‍රයත්න දරනු ලැබ තිබේ. ඒ අතුරින් මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් රචිත The God of Adam's Peak[1] නමැති ග්‍රන්ථය මේ පිළිබඳ ව දක්නා ලැබෙන විශේෂ පර්යේෂණයක ප්‍රතිඵලයක් සේ දැක්විය හැකි ය. මහාචාර්ය පරණවිතාන මහතා මේ කෘතියෙහිලා විස්තර කරන්නේ සමන් දෙවියන් යම දේවතාවා ලෙස හැඳින්විය හැකි බව යි. සමන් දේවාල සෙල් ලිපියෙහි එකී දේවාලය හැඳින්වෙන්නේ "ලක්ෂමණ මහා දේවාලේ" යනුවෙනි. සමන් දෙවියන් රාම රජුගේ සහෝදරයා වූ ලක්ෂමණ ලෙස හඳුන්වාදීමට ප්‍රයත්නයක් ගෙන ඇති බව මෙයින් පෙනේ. පොදු ජනතාව අතර පවා මේ අදහස තරමකට පැතිර පවතී. සමන්තභද්‍ර නමැති බෝධිසත්වයන් ලෙස ද සමන් දෙවියන් හඳුන්වාදීමට ඇතැම් උගතුන් කැමැත්තක් දක්වන බව පෙනේ.[2] මහාචාර්ය පරණවිතාන මහතාත් මේ මතය ද දරණ බව පෙනේ.[3] එසේ ම සමන් දෙවියන් වරම් දෙවිවරුන් සිව් දෙනා අතුරින් කෙනකු ලෙස ද සඳහන් ව තිබෙනු පෙනේ. සමන් දෙවියන් නැගෙනහිරට අධිපති දෙවියා ලෙස මෙහි සඳහන් වෙයි.[4]

---

1 The God of Adam's Peak - Paranavitana: Ascona (TGAP.) Page 22,24

2 ලක්දිව මහායාන අදහස් – මොරටුවේ සාසනරතන හිමි. ඇම්. ඩී. ගුණසේන (ලමඅද) 250-259

3 ලක්දිව මහායාන වාදය – එස්. පරණවිතාන – පුරාණ යුගය, තිසර ප්‍රකාශන (පුයු) 199 පිටුව

4 Ancient Ceylon. H. Parker- Uzac & Co. London (AC) 1909 Page 668

සමන් දෙවියන් යම, ලක්ෂ්මණ, සමන්තභද්‍ර හා වරම් දෙවිවරුන්ගෙන් කෙනෙකු ලෙස උගතුන් විසින් හඳුන්වා දී තිබෙන බැවින් මේ පිළිබඳ ව වැඩි වශයෙන් තොරතුරු විමසීමේ ආශාවක් කෙනෙකු තුළ හට ගන්නට පුළුවන. ''සුමන සමන්'' නමින් සමන් දෙවියන් හැඳින්වීම සාමාන්‍ය සම්ප්‍රදායයි. ''සුමන සමන් දෙවි පිහිටයි'' ආදී වශයෙන් පොදු ජනයා මෙය වහරති. බැලූ බැල්මටම පෙනෙන්නේ එක සමාන වචන දෙකක් එකවර භාවිත කොට සමන් දෙවියන් හඳුන්වනු ලබන බවකි. සමන් යන සිංහල වචනයේ පාළි ස්වරූපය සුමන සේ සැලකිය හැකි ය. සුමනකූට යනාදි තැන්වලින් ඒ බව සනාථ වෙයි. සුමනගේ කූටය හෙවත් සුමනගේ කන්ද යන්න එහි තේරුමයි. සමන්කුළ යනුවෙන් එය හෙළ රූපයට පෙරළිය හැකි ය. පොදු ජන විශ්වාසයත් මහාවංශාදී මූලාශ්‍රය ග්‍රන්ථත් ආශ්‍රයෙන් ලැබෙන සාධකත් අනුව සමන් දෙවියන්ගේ වාස භූමිය ලෙස සැලකෙන්නේ සමනොළ කන්දයි. සමනොළ කන්ද සුමන කූට නමින් පොත පතෙහි සඳහන් ය. එබැවින් සමන් දෙවියන් වෙසෙසා දක්වනු පිණිස සුමන කූටයේ සමන් දෙවියන් ලෙස භාවිතයට පැමිණ තිබෙන බව මෙයින් පෙනේ. **සුමන කූටයේ සමන් – සුමන සමන්** යනුවෙන් ප්‍රචාරයට පත් වනනට ඇතැයි අපට අනුමාන කරන්නට පුළුවන. එසේ නොමැති ව එක ම නම දෙවරක් භාවිත කිරීමේ තේරුමක් නැත. මුල් වචන වන සුමන යන්න සමනොළ කන්දේ වාසය කරන බව දැක්වීම සඳහා යොදනු ලබන බවත් අපර පදය දෙවියන්ගේ නම ලෙස භාවිත වන බවත් සැලැකිය හැකි ය. විභීෂණ, කතරගම, උපුල්වන් ආදී දෙවි වරුන්ට මේ ආකාරයට නම් භාවිත වී නො මැති වීම විශේෂතාවකි. සමන් දෙවියන් ඒ හැම කෙනෙකුට ම වඩා වෙනස් දේවතාවකු ලෙස හැඳින්වීමට මේ නම ද හේතු වී ඇති සේ ය.

බුදුන් වහන්සේගේ දෙවැනි ලංකා ගමන හා සම්බන්ධ සිද්ධි සුමන අපගේ විමසුමට භාජනය කැරෙන මේ සුමන සමන් දෙවියන් නොවන බව ඉඳුරා ම පැහැදිලි බව මෙහි ඉන්තින් ද සඳහන් කරන ලදී. සමන් දෙවියන්, මුනිදුන්ගේ ප්‍රථම

ලංකා ගමනේදී ම බණ අසා සෝවාන් වූ බව පැවසෙන ප්‍රකාශය ම ඒ බව සනාථ කරයි. එබැවින් සමිධි සුමන හා සමන් දෙවියන් අතර සබඳතාවක් හෝ සමානත්වයක් හෝ නොපවත්නා බවත් පැහැදිලි ය.

සමන් දෙවියන් යම ලෙස ඔප්පු කිරීම පිණිස කරුණු දක්වන මහාචාර්ය පරණවිතාන මහතා භූරිදත්ත ජාතකයේ එන මේ ගාථාව ද ගෙනහැර දක්වයි.

ධාතා විධාතා වරුණෝ කුවේරෝ
සොමො යමො චන්දිමා වායු පුරිසො
එතෙහි යඤ්ඤං පුථුසො යජිත්වා
අජ්ඣායකානං අථ සබ්බකාමෙ[1]

ධාතා විධාතා වරුණ කුවේර යෝම යම චන්දිමා වායු පුරිස යන මේ දෙවිවරු වනාහි නොයෙක් අයුරින් යාග කොට බමුණන්ට කැමැති සියලු සම්පත් දීමෙ තන්තුරුවලට පත් වූහ.[1]

මෙය සිංහලයට පරිවර්තනය කරන පන්සිය පනස් ජාතක පොතෙහි සඳහන් වන්නේ මෙසේ ය.

''ධෘත රාෂ්ට්‍ර නම් දිව්‍ය රජ්ජුරුවෝ ද, වරුණ නම් දිව්‍ය රජ්ජුරුවෝ ද, කුවේර නම් දිව්‍ය රජ්ජුරුවෝ ද, සුමන නම් දිව්‍ය රජ්ජුරුවෝ ද, චන්ද්‍ර දිව්‍ය පුත්‍රයෝ ද, සූර්ය දිව්‍ය පුත්‍රයෝ ද යන මේ සියලු දිව්‍ය රජ දරුවෝ අනේක ප්‍රකාර වූ යාග කොට......[2] යනුවෙනි.

මෙහි පාළි ජාතක පොතෙහි ආ 'යමො' යනු යම දේවතාවා ය. එය සිංහල පරිවර්තනයෙහි එන්නේ සුමන දිව්‍ය රජ්ජුරුවෝ යනුවෙනි. මේ පිළිබඳ ව සඳහන් කරන පරණවිතාන මහතා ඒ අපේ ප්‍රස්තුතයට අදළ සුමන සමන් දෙවියන් බව පවසයි. ජාතක පොත හෙළයට පෙරළෙන සමයෙහි සමන්, යම ලෙස පිළි ගැනීමක් පවතින්නට ඇතැයි පරණවිතාන මහතා දක්වයි.[3]

1 ජාතක පාළි. භූරිදත්ත ජාතකය. බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලා.
2 පන්සිය පනස් ජාතක පොත. වේරගොඩ අමරමෝලි සංස්. 147 පිටුව
3 T G A P - Paranavitana. Page 240

වෙනත් සාහිත්‍ය කෘතියකින් මේ මතය ඔප්පු කරන්නට සාධක සොයා ගත නො හැකි ය. සන්දේශ කාව්‍යයන්හි ද පූජාවලිය වැනි සාහිත්‍ය කෘතීන්හි ද මෙ වැනි අදහසක් අන්තර්ගත වී නො මැතියි. සුමන නම් දිව්‍ය රජ්ජුරුවෝ යන නම යම දෙවියාට පර්යාය ලෙස යෙදුණු වෙනත් තැනක් ද සොයා ගැනීම උගහට ය. එබැවින් පොදු ජනතාවගෙන් වැඳුම් පිදුම් ලබන සුමන සමන් දෙවියන්, යම ලෙස සැලකීමට පරණවිතාන දක්වන මේ නිදසුන ප්‍රමාණවත් නො වන බව ද සඳහන් කළ හැකි ය. ඒ සමඟ ම එතුමා සමන්තභද්‍ර ලෙස ද සමන් දෙවියන් හැඳින්වීමට පෙළඹී ඇති නිසා ද මේ සැකය තව දුරටත් තහවුරු වෙයි. පරණවිතාන මහතා දක්වන අවශේෂ කරුණු ද සලකන විට පිළිගත හැක්කේ සමන් දෙවියන් ඉන්දීය සම්භවයක් ඇත්තෙකු ලෙස විස්තර කරන්නට එතුමා ප්‍රයත්නයක් ගෙන ඇති බවයි. සොයා ගත හැකි සාක්කිවලින් පෙනෙන්නේ සමන් දෙවියන් දේශීය දේවතා කෙනකු මිස ඉන්දිය සම්භවයක් ඇත්තකු නො වන බව ය.

රාජශේඛරයන්ගේ වාර්තාවක් උපුටා දක්වන පරණවිතාන මහතා ධර්මරාජ හා යම යනු පර්යාය පද ලෙස සලකයි. රුහුණු කන්දක (ශ්‍රී පාද කන්ද) තාපසාරාමයක් පැවැති බව ද එහි ප්‍රධානයා අගස්ත්‍ය බව ද රාජශේඛර සඳහන් කරයි යි හෙතෙම වැඩිදුරටත් පවසයි. මේ සඳහන පිළිගත හොත් සමනොළ කන්දේ ධර්මරාජ ගල අගස්ත්‍යගේ හෝ යමගේ තාපසාරාම යක් පැවැති ස්ථානයක් ලෙස පිළිගත යුතු ය. එසේ සැලකීමට තරම් සාක්කි ද නො මැතියි. ධර්මරාජ ගලෙහි ඇති සෙල් ලිපියේ ද එවැනි අදහසක් ප්‍රකාශ වී නැත. එහි තවුසකු විසූ බව ජනශ්‍රුතියෙහි පවා සඳහන් වෙතත් ඒ අගස්ත්‍ය නොවේ. ධර්මරාජ ගලේ සෙල් ලිපියේ කොටස් මැකී ඇතත් කියැවිය හැකි කොටස්වලින් ප්‍රකාශ වන්නේ මෙහි වුසූ ධර්මරාජ තාපස තෙම බුදු බව ප්‍රාර්ථනා කරමින් ධර්මරාජ ගලේ ගල් පඩි පෙළ ද තැන වූ බව ය. මේ පර්වතය ධර්මරාජ ගල යන නම ලබා ඇත්තේ අගස්ත්‍ය නිසා නොව එහි පියගැට පෙළ ද කැරවූ ධර්මරාජ තාපස තුමා නිසා බව මෙයින් තහවුරු වෙයි.

ධර්මරාජ ගලේ එම තාපස තුමාගේ රූපය ද සටහන් කොට තිබේ. මේ කරුණු අනුව යම, අගස්ත්‍ය, සුමන යන අය දෙවි වරුන් ලෙස එකට ගැලපිය නො හැකි බව පැහැදිලි වෙයි.

සමනොළ නගින වන්දනා කරුවන් එහි යන්නේ ''කරුණාවයි, කරුණාවයි'' කියමිනි. පොදු ජනතාව එසේ කියමින් සමනොළ නගින්නේ යම රජු සිහිපත් කරමිනි යි මහාචාර්ය පරණවිතාන සූරීහු සඳහන් කරති. මේ බලන්න.

> ''... යම රජුට ශමන කියල නමකුත් සකු බසේ එනවා. මේ නමය සමන් කියල සිංහලට පෙරලිලා තියෙනවා. නාට්‍ය රස අටෙන් කරුණා රසයට යම රජු අදිපති බව බරත නාට්ටිය සාස්තරේ කියල තියෙනවා. සිරිපාදෙ වඳිනන යන අය අදත් කරුණාවයි කියල හඬ නගමින් යන්නෙ මේ නිසයි.''[1]

මේ ප්‍රකාශයෙන් ද පෙනෙනුයේ සමන් දෙවියන් හුදෙක් දේශීයත්වයට වඩා ඉන්දීය සම්භවයකට නැකම් කියන බව ය. ''කරුණාවයි'' කියමින් බැතිමතුන් සමනොළ නගින්නේ කරුණා රසයට අධිපති යම දේවතාවා සිහිපත් කරමින් බව පරණවිතාන මහතා ඉහත ඡේදයේ සඳහන් කරයි. එහෙත් අතීතයේදී සිට ම මෙරට ජනයා එසේ කළේ සමන් දෙවියන්ගේ පිහිටාරක්ෂාව පතා ගෙන මිස යම දේවතාවා සිහි පත් කොට ගෙන නොවේ. ගමනේ ඇති අපහසුව නිසා ම ජනයා තුන්සරණය කියන්නටත් එකිනෙකා හමු වූ විට ආමන්ත්‍රණ පදයක් ලෙස කරුණාවයි කියන්නටත් පුරුදු වී ඇති බව පෙනේ. සමන් සුරිඳු කරුණාවයි යන්න කෙටි කර කරුණාවයි කියා වැඩි වශයෙන් භාවිත කැරෙන අතර එය පලමු කී ලෙස 'සමන් සුරිඳු කරුණාවයි' යනුවෙන් ම ද ජනයා විසින් භාවිත කරනු ලැබේ. සමනොළ නගින්නට ගිය කිසිවකු තුළ යම දේවතාවා පිළිබඳ කිසිදු අවබෝධයක් හෝ දැනුමක් තිබුණු බවක් චිරාගත ජනශ්‍රැතිවලින් ද පැහැදිලි නො වෙයි.

---

1 රසවාහිනී - 1970 මාරතු කලාපය. සිරිපා පුරාණය - සෙනරත් පරණවිතාන.

කැනීම්වලින් හමු වී ඇති ප්‍රතිමා ලක්ෂණ අනුව ද සමන් දෙවියන් යම ලෙස ඔප්පු කිරීමට පරණවිතාන මහතා ප්‍රයත්නයක යෙදේ. යමගේ යැයි සැලකෙන සමහර ප්‍රතිමා ගැන විස්තර කරන හෙතෙම ඒවා විහාරස්ථානාදියෙහි දක්නා ලැබෙන සමන් දේව ප්‍රතිමාවලට සමානකම් දක්වන බව පවසයි. දඹුලු ලෙණෙහි දක්නා ලැබෙන සමන් දේව ප්‍රතිමාවේ අතින් ගත් කිසිවක් නැතිවාක් මෙන් ම ඇතැම් යම රූපවල ද අතින් ගත් කිසිවක් නො මැති බව ද පරණවිතාන සූරීහු පවසත්. ගොඩකවෙල විහාරස්ථානයේ සමන් දේව ප්‍රතිමාවෙහි අතින් ගත් යෂ්ටියක් වැනි යමක් ඇති බවත් එය ත්‍රිශූලයේ සංවර්ධිත අවස්ථාවක් සේ සැලැකිය හැකි බවත් එතුමෝ පවසති. ඇතැම් යම රූපවල ද මෙසේ අතින් ගත් යම් යම් වස්තු ඇති බව පවසන එතුමෝ ලෝකපාල පිළිමවලත් සමන් දෙවි පිළිමවලත් ස්වරූපය සසඳා බැලීමෙන් ද තම මතය සනාථ වන බව ප්‍රකාශ කරත්.[1]

සමන් දෙවියන් රාමගේ සොහොයුරු ලක්ෂමණ බව පැවැසෙන ප්‍රකාශය සමන් දේවාල සෙල්ලිපියේ පැහැදිලිව දැක්වෙන බව මෙයට පූර්වයෙහි ද සඳහන් කරන ලදී. රාම රාවණ යුද්ධය බළංගොඩ අසල දෙතනගල කන්ද පා මුල සිදු වූ බව ප්‍රදේශයේ පැතිරී ඇති ජනශ්‍රැතිවලින් කියැවෙයි. ඊට සම්බන්ධ ග්‍රාම නාම කිහිපයක් ද තිබේ. සීතාගල, දෙතනගල, රාස්සගල, ඕලු ගංතොට ආදී ගම්නම් රාම රාවණ පුවත හා සම්බන්ධ ය. කෙසේ වෙතත් ලක්ෂමණ සමන් දෙවියන් ලෙස පිළිගැනීමේ අදහස මුල් වරට දකින්නට ලැබෙන්නේ 16 වැනි සියවසේදී නිසා එය හුදෙක් බමුණු බලපෑම් අනුව ම සිදුවූවක් ලෙස සැලකීමට පුළුවන. කෝට්ටේ යුගයේදී බමුණු බලපෑම් බහුල ව තිබුණු බවට ජනශ්‍රැති මෙන් ම ඓතිහාසික සාධක ද තිබේ.[2] රාමායනය භක්ති කාව්‍යයක් සේ සලකන බ්‍රාහ්මණයන් පොදු ජන ගෞරවාදරයට පාත්‍ර වූ සමන් දෙවියන් ලක්ෂමණ ලෙස හැඳින්වීමට පෙළඹෙන්නට ඇතැ යි.

---

1 TGAP Page 51

2 (ජ. ජර) 47, 159 පිටු.

සතපන්නට පුළුවන. සමන් දෙවොල ගොඩ නැංවීමට මුල් වූ ආර්යකාම දේව ද ඔහුගේ මුණුබුරු නිලපෙරුමාල් බ්‍රාහ්මණයෝ ය.

සවැනි පැරකුම්බා රජතුමාගේ සමන් දේවාල සන්නසෙහි ලක්ෂමණ මහා දේවාලය යන වචනය ඇතුළත් වී ඇත්තේ මේ බමුණු බලපෑම් නිසා බව මහාචාර්ය අභය ආර්ය සිංහ මහතා පෙන්වා දෙයි. ඔහු දිනමිණ පුවත්පතට ලියූ ලිපියකින් උපුටා පළ කරන පහත සඳහන් පාඨයෙන් ඒ බව පැහැදිලි වෙයි.

> "....දේශීය දෙවියන් සඳහා තැනුණු ප්‍රකට දේවාලයන් තුළට විදේශීය දෙවියන් කැඳවීමට බ්‍රාහ්මණයෝ සියුම් උපාය යෙදූ හ. අපේ ඇතැම් රජවරු ද ඒ උගුලට අසු වූවා සේ ය. සමන් වෙනුවට ලක්ෂමණ යන නම හවන පරාක්‍රමබාහු රජතුමා දුන් සමන් දේවාලය සන්නසට ඇතුළු කැර ඇත්තේමේ හේතු කොට ගෙන ය."[1]

සවන පැරකුම්බා රජු දවස සිටි බමුණන් විසින් මෙසේ කරන්නට ඇත්තේ රාමායනය කෙරෙහි ඔවුන් තුළ පැවැති අචල භක්තිය නිසා වන්නට ඇත. පරණවිතාන මහතා විශ්වාස කරන්නේ ලස්-සමන යන වචන ඇසුරින් බමුණන් ලක්ෂමණ යන්න නිපදවා ගන්නට ඇතැ යි කියා ය. මෙහි 'ලස්' යන්නෙන් ශ්‍රී පාද ලාඤ්ඡණය අදහස් කැරේ. (පද ලස යන අරුතිනි) එවිට ලස් සමන යනු ශ්‍රී පාදයේ සුමන යන්න ය. සවන පැරකුම්බා රජු දවස සිටි බමුණන් ලස්සමන යන්න ලක්ෂමණ යනුවෙන් පිළිගන්නට ඇතැයි මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා ද විශ්වාස කරන බව පෙනේ.[2] මහාචාර්ය අබය ආර්යසිංහ මහතාත් මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාත් පිළිගන්නේ 'ලක්ෂමණ' යන්න බමුණන්ගේ නිර්මාණයක් ලෙස ය. දුණු ඊතල අතින් ගත් සමන් දේව ප්‍රතිමා කිහිපයක් අපට ද දකින්නට ලැබිණි. වන්දනා කාලයේදී

---

1 දින. ලක්ෂමණ සමන් දෙවොලට වැදුණු හැටි නමැති ලිපිය. අබය ආර්යසිංහ.

2 TGAP – 28 Page.

බැතිමතුන්ට වැඳ පුද ගැනීම පිණිස සමනොළ කන්දේ සමන් දේවාලයේ තබනු ලබන සඳුන් රූපයේ ආයුධ කිසිවක් නැත. ඒ සමඟ තිබෙන රිදී රූපයේ අතෙහි දුණු ඊතල තිබේ. එය මෑතදී සිඩ්නි එල්ලාවල මහතා විසින් තනවන ලදී. (එල්ලාවල මහතා කලක් සිරිපාදයේ භාරකාර ධුරය දැරී ය.) මේ දුණු ඊතල අතින් ගත් සමන් දේව රූපයෙන් කියැවෙන්නේ සමන් දෙවියන් ලක්ෂමණ බව ය. රාම විසින් විදින ලද ඊතලයෙන් රාවණ මියැදුණේ ය. එය මෙයින් සංකේතවත් කැරෙයි. සමන් දෙවියන් සෝවාන් වූ කෙනකු ලෙස ඉතා ප්‍රකට ය. එවැනි කෙනකු ඊතල භාවිත කොට මිනී මැරීම නො කරන බව ද බෞද්ධ දර්ශනය අනුව පැවසිය හැකි ය. අනෙක් කරුණ නම් බුදුන් වහන්සේ ජීවමානව සිටි ක්‍රි. පූ. සවන සියවසට බොහෝ කලකට පෙර රාම රාවණ පුවත සිදු වූ බව වාර්තා වීම ය. රාම රාවණ සටන සිදු වූයේ බුද්ධ පරිනිර්වාණයට අවුරුදු 1100 කට පෙර යැයි ඇතැම් උගත්තු පවසති.[1] මේ කරුණු අනුව චිරාගත ව පැවත එන සමන් දෙවියන් ලක්ෂමණ විය නො හැකි ය. එය හුදෙක් බ්‍රාහ්මණයන් විසින් නිපදවන ලද කල්පිතයක් විය හැකි ය.

අපට දකින්නට ලැබුණු පැරණි ම සමන් දේව ප්‍රතිමා දෙක වන්නේ ඓතිහාසික දඹුලු ලෙන තුළ තිබෙන දරුමය පිළිමයත් කලින් ද සඳහන් කැර ඇති පැල්මඩුල්ලේ ගල්පොත්තාවල පන්සලේ සමසක් ද සමනොළ කන්දේ සමන් දෙවොලේ සමසක් ද තබා තිබෙන සඳුන් දැවමුවා පිළිමයත් ය. දඹුල්ලේ පිළිමය සාමාන්‍ය මිනිස් ශරීරයකට වඩා මඳක් විශාලය ජටා මකුටයකින් යුත් හිස සහිත ප්‍රතිමාවේ මුහුණ සුන්දර ය, ප්‍රතාපවත් ය. ඒ අසලින් ඇති උපුල්වන් දෙවිඳුගේ රූපයේ මුහුණට වඩා මෙහි මුහුණෙහි ප්‍රසන්න බවක් තිබේ. දැත ඉදිරියට දිගු කැර ගෙන සිටින සේ තෙළා ඇති මෙහි දබරඟිල්ල මහපටැඟිල්ල තෙක් නමා තිබේ. මේ ප්‍රතිමාවට වාහනයක් නො මැතියි. මෙහි ශරීර වර්ණය සුදු ය. සමන්තකූටයට වැඩම කරවනු ලබන සඳුන් ලී ප්‍රතිමාව ගැන මීට

1 අපේ යටගියාව – ඊ. තෙන්නකෝන්. ගුණසේන සමාගම, කොළඹ. (අය) 15 පිටුව

පෙර ද සඳහන් කරන ලදී. එය අඩියකට වඩා නුසු සිහින් පිළිමයක් වීම සඳහන් කළ යුතු විශේෂ ලක්ෂණයකි. දඹුල්ලේ තිබෙන සමන් දේව ප්‍රතිමාව ගැන දඹුලු තුඩපතෙහි මෙසේ සඳහන් වෙයි.

> "......... මී ලී මකර තොරණ සහිත පිටාවුවට පිට ලා වැඩ සිටිනා ලෙස කළ පස්රියන් ශෛලමය බුදුරුව ඇතුළුව බුද්ධ ප්‍රතිමාවන් සතලිස් සය නමක් හා මෛත්‍රී නාථ දෙනම ද උපුල්වන් සමන් දෙව් රූ දෙනම හා වළගම්බාහු නිශ්ශංක රාජ ප්‍රතිබිම්බ දෙනම ද ලි පාම් කොට........."[1]

සමනොළ කන්දට වර්ෂික ව වැඩම කැර ගෙන යන සඳුන් දැවමුවා සමන් දෙව් රුව දේවප්‍රතිරාජ ඇමැතිතුමා විසින් කරවන ලද ප්‍රතිමාව ම යයි පිළිගත හොත් එය දැනට අප අතර පවතින පැරණි ම සමන් දෙව් පිළිමය ලෙස සැලකීමට පුළුවන.

හංස සන්දේශයෙහි සඳහන් 'දිමුත් සමන් බොක්සැල් සුරිඳු නෙක් කොට' යන පාඨයෙන් කියැවෙන පරිදි සමන් දෙවියන් බොක්සැල් නොහොත් බොක්සල් යන පදවලින් ද හැඳින්වී තිබෙන බව පෙනී යයි. බොක්සැල් යන්න බිඳී ඇත්තේ සංස්කෘත 'භෝගශාලින්' යන්නෙන් යැයි මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරිහු පෙන්නා දෙති. මෙය සම්ඩි සුමන යන්නට සමාන බව ද එතුමා පවසයි.[2] එහෙත් සම්ඩි සුමන හා සුමන සමන් යනු දෙ දෙනකු ලෙස සැලකිය යුතු බව මෙහි කලින් සඳහන් කරන ලදී.

ධෘතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ යනුවෙන් ඇතැම් තැනක විස්තර වන සතර වරම් දෙවියන් අතරට සමන් දෙවියන් ඇතුළු වී ඇති අයුරු විස්තර කරන එච්. පාකර් මහතා ඔහු නැගෙනහිර අධිපති දෙවියා ලෙස කපුරාළවරුන් පැවසූ බව සඳහන් කරයි.[3] සමන් දෙවියන්ගේ

---

1 බලන්න: දඹුලු තුඩ පත – ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය – නන්දසේන මුදියන්සේ - ඇම්. ඩී. ගුණසේන සමාගම. (ශාලිස) 68 පිටුව.

2 TGAP.-38

3 CA–Page 668

වර්ණය ලෙස පාකර් මහතා දක්වන්නේ කහ පාට ය. එය ඇත් දළ පාට වැනි සුදු පාට විය හැකි ය. ඩේවි පවසන්නේ එය සුදු පාට ලෙස ය. සමන් දෙවියන් කොළ පැහැති බව පරණවිතාන මහතා සඳහන් කරතත් ලක්දිව අප දුටු සියලු ම සමන් දේවරූප සුදු පැහැයට නොහොත් ඇත් දත් පාටට හුරු බව සඳහන් කළ යුතු ය. ඉම් පිළිබඳව තොරතුරු විමසූ කවත් විදේශීය ලේඛකයකුගේ වාර්තාවක ද සඳහන් වන්නේ කොළ පැහැති සමන් දේව රූප තමාට ද දක්නට නො ලැබුණු බව ය.[1] මෙයට එක් හේතුවක් සේ පෙනෙන්නේ සමන්තභද්‍ර නමැති මහායාන බෝසතුන් සමන් දෙවියන් ලෙස හඳුනා ගන්නා විද්වතුන් ඔවුන්ගේ පැහැය සමන් දෙවියන් කෙරෙහි ද ගලපන්නට උත්සාහ කිරීම ය. සමන්ත භද්‍ර බෝසත්හු පලාවන් පැහැයෙන් මෙන් ම කහ පැහැයෙන් ද යුක්ත ය හ. මොරටුවෙ සාසනරතන හිමියන්ගේ ලක්දිව මහායාන අදහස් නමැති කෘතියෙහි සමන් දෙවියන් සමන්තභද්‍ර ලෙස විස්තර කැර ඇත්තේ මෙසේ ය.

> "......සමන්තයගේ කූටය සමන්තකූටය වූ බැව් සිතා ගත හැක්කේ ය. සමන්තභද්‍ර ලංකාවෙහි සමනල කන්ද සුබාවතිය කර ගත්තේ ය. මෙතුමා ඉන්දියාවෙහි එතරම් ශ්‍රේෂ්ඨ දෙවියකු බවට නොපැමිණි නමුදු චීනයේ ඉතා ශ්‍රේෂ්ඨ දෙවියෙකි. සමන්තභද්‍ර බෝධිසත්ත්වයන්ගේ වර්ණය පලාවන් පැහැය ය. සමන් දෙවියන්ගේ පැහැය නිල් පැහැය ය. නිල් පැහැය මෙන් ම පලාවන් පැහැය කවි සමයෙහි සලකනුයේ එක සමානවය. සමන්තභද්‍ර කහ පැහැයෙන් ද යෙනී සිටින්නාක් මෙන් සුමන දෙවියන්ගේ රූපය ද එම පැහැයෙන් සිතියම් කරන්නේ ය. සමන්තභද්‍ර බෝධි සත්ත්වයන්ට මෙන් ම සුමන දෙවියන්ට ද වාහනයක් ඇත. දෙදෙනා ම උත්පලයක් අතින් දරති.[2]

මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා ද සමන් දෙවියන් සමන්තභද්‍ර ලෙස හඳුන්වා දීමට උත්සාහයක් ගෙන ඇති

---

1 The sacred footprint–Markus Aksland (TSP) Oslo 43 පිටුව.
2 ලක්දිව මහායන අදහස් - සාසනරතන හිමි. ඇම්. ඩී. ගුණසේන සමාගම 1962 (ලමඅද) 254. පිටුව.

බව එතුමාගේ ලිපියකින් පැහැදිලි වෙයි.[1] පරණවිතාන සූරීහු පූර්වෝක්ත ලිපියෙහි මෙසේ සඳහන් කරති.

> ''...... සමන් මහා යානිකයන්ගේ ප්‍රධාන බෝධිසත්වවරුන් අට දෙනාගෙන් කෙනකු වන සමන්තභද්‍ර ලෙස හැඳින්වීමට ද හේතු තිබේ. ඔහු ඉන්දිය බුදු සමයෙහි වැදගත් තැනක් නො උසුලන නමුත් චීන බුදුසමයෙහි ප්‍රධාන තැනක් ගනී. ඔහු පිළිබිඹු කොට ඇත්තේ කොළ පැහැයෙනි. වාහනය ඇතෙකි. සමන් දෙවියන්ගේ වාහනය ද ඇතෙකි. සමන් දෙවියා ලංකාවෙහි පූජනීය කන්දක් ආශ්‍රය කරන්නාක් මෙන් ම සමන්තභද්‍ර චීනයේ පූජනීය කන්දක් ආශ්‍රය කරයි......''[1]

සමන්තභද්‍ර හා යම ලෙස හෝ ලක්ෂමණ ලෙස හෝ සමන් දෙවියන් සැලකීමට ප්‍රබල සාධක නො මැති බව ඉහත සඳහන් කරුණුවලින් පැහැදිලි වෙයි. මහාචාර්ය පරණවිතාන මහතා එක ම දෙවියන් පිළිබඳ ව මත දෙකක් සඳහන් කිරීම මෙහිදී සැලකිල්ලට ගත යුතු ගැටළුවකි. සමන් දෙවියන් යම ලෙස සැලකීමට අමතර ව සමන්තභද්‍ර ලෙසත් එතුමා විසින් ම විස්තර කරනු ලැබීම නිසා තමන්ගේ පළමු අදහස එමගින් උල්ලංඝනය වන බව අපට සැලැකිය හැකි ය. සමන් දෙවියන්ගේ නම බුදුන් වහන්සේගේ ලංකා ගමන් දෙකක් සමඟ සඳහන් කරමින් මහාවංශය දක්වන තොරතුරු අනුව සලකන විට පෙනෙන්නේ එතුමන් සමන්තකූටය මධ්‍යස්ථානය කොට ගත්, ඒ අවට ප්‍රදේශයට - විශේෂයෙන් ම මහවැලි නදියෙන් දකුණේ පිහිටි ප්‍රදේශයට සම්බන්ධ වූ කෙනකු ලෙස ය. එමෙන් ම ශ්‍රී ලංකාවේ දේවත්වය ආරූඪ කැරුණු බොහෝ දෙනාගේ කතා පුවත් ද සමඟ සමන් දෙවියන් හා සම්බන්ධ පුවත් සසඳා බලන කල බැස ගත හැකි එක් නිගමනයක් වන්නේ ඔවුන් මෙරට පහළ වූ සජීවී චරිතයක් බව ය. මින්නේරි දෙවියන් නමින් රජ රටදී පුද ලබන්නේ මහසෙන් රජු බව ප්‍රකට ය. අනුරාධපුර පෙදෙස් බද වන්නිකරයේ වුසූ ඉන්දිය සම්භවයක් ඇති අරියනායගම් නමැති පෙදෙස් බලවතා පසු කලෙක අය්යනායක දෙවියන් ලෙස ජනතාවගේ ගෞරවයට

---

1 ලක්දිව මහායානවාදය – පූ. යු. 200 පිට

පාත්‍රව ඇත.[1] මේ ලස ලංකාවේ දේවත්වයට නැංවී ඇත්තේ ජන හදවත්වලට ඉතාමත් ළං වූ ප්‍රදේශ නායකයන්, පාලකයන් හා ප්‍රභූවරුන් බව පෙනේ. ඔවුන්ගෙන් සිදු වූ සේවාව ද ඔවුන් කෙරෙහි ඇති ආදරය හා කරුණාව ද භය පක්ෂපාතිත්වය වැනි කරුණු ද ඔවුන්ගේ මරණින් පසු ජනතාව ඔවුන්ට දේවත්වය ආරෝපණය කිරීමට විශේෂයෙන් හේතු වී ඇති කරුණු ය. කුරුණෑගල් දිස්ත්‍රික්කයේ ජනතාව විසින් අදහනු ලබන "බණ්ඩාර දෙවිවරුන්" එකී ජනතාව සමඟ කලක් එකට විසූ ප්‍රභූවරුන් බව පෙනේ.[2] මේ කරුණුවලින් බැස ගත හැකි එක් නිගමනයක් නම් සමන් දෙවියන් ද සබරගමු පළාතේ හා ඒ අවට රුහුණු ප්‍රදේශයේ විසූ ජනප්‍රධානයකු බව ය. එය සෙසු ශ්‍රී ලාංකික දෙවිවරුන් සම්භවය ලද ආකාරය ගැන සලකන කල බැස ගත හැකි නිගමනයයි. බුදුන් වහන්සේ ගේ ලංකා ගමන් හා සමඟ සමන් දෙවියන් සම්බන්ධ කොට සඳහන්නේ ඒ ප්‍රභුත්වයත් නායකත්වයත් නිසා යැයි උපකල්පනය කළ හැකි ය. දූන් බින්තැන්නේ වෙසෙන වැද්දෝ ද ඒ බව ප්‍රකාශ කරති. වැද්දන්ගේ ජනශ්‍රැතිවලින් කියැවෙන සාක්කිවලට අනුව සමන් දෙවියන් යක්ෂ ගෝත්‍රිකයන්ගේ නායකයෙකැයි සලකන්නට සිදුවේ. මහාවංශය සඳහන් කරන පරිදි මහවැලි නදියෙන් දකුණේ රුහුණු පෙදෙසින් වැඩි කොටසක් සබරුන්ගෙන් ගහන විය. සබරුන් යනුවෙන් හැඳින්වෙන වැද්දෝ තුමූ යක්ෂයන් ලෙස ද හඳුන්වා ගනිති.[3] ඒ අනුව සලකතොත් සමන් දෙවියෝ යක්ෂ ගෝත්‍රිකයන්ගේ නායකයා ය. සම-භාන්ගේ අදහස සමන් දෙවියන් සබරගමුවේ දූරාතීතයේ විසූ දේවගෝත්‍රිකයන්ගේ ප්‍රධානයා කියා ය. යක්ෂ, නාග, රාක්ෂ, දේව යනාදී වශයෙන් හැඳුන්වුණු මිනිස් කොට්ඨාශ ගණනාවක් ප්‍රාග් ඓතිහාසික ශ්‍රී ලංකාවේ වාසය කළ බව පුරා විද්‍යාත්මක නොවන සාධක මගින් ඔප්පු වෙයි. මෙහි

---

1 ලාංකික දෙවිවරු – මාපොටේ චන්ද්‍රජෝති හිමි. (ලාංදෙ) 128–129 පිටු.

2 දුදුරු ඔය බඩ ජන ඇදහීම් – ඇන්. ටී. කරුණාතිලක. ගොඩගේ සහෝදරයෝ. (දැඔජ) 27 පිටුව

3 තිසාහාමි හා සුදු බණ්ඩියා යන වැදි ප්‍රධානයන් සමඟ කළ කතාබහ – පටිගත කැර ඇත.

දේව හා යක්ෂ යනු මේ ප්‍රදේශයේ විසූ එක ම ජන කොටසක් හැඳින්වීමට යෙදූ පොදු වචනයක් සේ සලකනු ලැබේ.[1]

ක්‍රිස්තු පූර්ව යුගයේ සබරගමුව පාලනය කළ නායකයන් පරුමක යනුවෙන් හඳුන්වනු ලැබ ඇති බව එකී පෙදෙස්වල පවත්නා බ්‍රාහ්මී සෙල්ලිපි කිහිපයක සඳහන් වෙයි. මේ පරුමක වරුන් ගෙන් බොහෝ දෙනා ප්‍රදේශාධිපතියෝ ය.[2] බලංගොඩ ඔබ්බෙන් පිහිටි කූරගල පර්වතයේ කොටා ඇති සෙල්ලිපියක පරුමක සුමන කෙනකු ගැන සඳහන් වෙයි. ඒ සුමන අංජ සාකච්ඡාවට ලක් වන සමන් දෙවියන් ලෙස ම ඉප්පු කිරීමට සාධක නැත. ඒ සුමන නමින් යුත් වෙනත් ජන ප්‍රධානයෙකි. දේවත්වය ආරෝපණය කොට ජනතාවගේ උත්දනයට හා ගරු සරුවට ලක් වූ පසුසු දෙවිවරුන් ඒ තත්ත්වයට පත් වූ අන්දම පූර්වාදර්ශයක් කොට ගත හොත් රත්නපුර සමන් දේවාලය ප්‍රධාන කොට ඇති සෙසු සමන් දේවාලවලදී ද ජනතා උපහාර ලබන දේවතාවා ඒ ප්‍රදේශයේ විසූ පරුමක වරයකු බවට අනුමාන කළ හැකි ය. සැවුල් සන්දේශ කතුවරයා සඳහන් කරන බිසෝ දෙවියන් පිළිබඳ පුවත මේ උපකල්පනය තව දුරටත් සනාථ කරවයි. ලංකාතිලක විහාරයේ මේ සියලු දෙවිවරුන් ඇඳ තිබෙන හෙයින් සමකාලීන ජනතාවගේ හදවත් තුළ මේ අදහස පවතින්නට ඇති බව එයින් තහවුරු වෙයි. කප් සිටුවීම මගින් නිරූපණය කර පෙන්වන ලිංගික සංසිද්ධියත් කුඹල් පෙරහර හා සම්බන්ධ නව ජීවිතයක ආරම්භයත් දිය කැපීමෙන් පිළිබිඹු කැරෙන ලිංගික ජීවිතයේ උත්කර්ෂවත් අවස්ථාවත් ගැන සලකන කල ද සමන් දෙවියන් ජන නායකයකු ලෙස සැලකීම අසීරු නො වන බව සඳහන් කළ හැකි ය. එසේ ම මහියංගණයේ සමන් දේවාලයේදී පුද ලබන 'මහ ලොකු' හෙවත් සමන් දෙවියන් ගේ වැඩි මහල් සහෝදරිය ගැන ද සලකන කල පැවැසිය හැක්කේ සමන් දෙවියන් ප්‍රදේශයේ ප්‍රභූ පවුලක විසූ ජන ප්‍රධානයකු බව ය.

---

1 ලංකා ඉතිහාසය - 1 කාණ්ඩය - 1 භාගය විද්‍යාලංකාර වි වි. සිංහල පරි. (ලංඉති) 133 පිටුව.

2 Inscription of Ceylon. Vol-1 S. Paranavitnna 1 Page xxii

මෙම රට ජනතාවගෙන් වැඳුම් ලබන බොහෝ දෙවි-වරුන්ට වාහනයක් ද වෙයි. එසේ ම සමන් දෙවියන්ට ද වාහනයක් ඇත. ඒ සුදු ඇතෙකි. ජන සාහිත්‍යයේ මේ සුදු ඇතා හඳුන්වනු ලබන්නේ "ඇලි ඇතා" යන නමිනි.[1] සමන් දෙවියන් ද සුදු පැහැයෙන් නිරූපණය කළ කලාකරුවා ඔවුන්ගේ වාහනයටත් ඒ ධවල වර්ණය ම යොදන්නට ඇතැයි සිතන්නට පුළුවන. සමන් දෙවියන් සුදු වර්ණයෙන් දක්වීමට ජන කලාකරුවා කල්පනා කරන්නට ඇත්තේ ඔවුන්ගේ සෞම්‍ය ගුණය එ මගින් ද විදහා පෙන්වීමට විය හැකි ය. ඔවුන් මුණි බණ අසා සෝවාන් වූ පුවත සමස්ත ශරීර වර්ණයෙන් ම සංකේතවත් කොට පෙන්වීමට ජන කලාකරුවා කල්පනා කළ බව පෙනේ.

ශ්‍රී පාද වන්දනාව ආරම්භයට පෙර ඇහැල කණුව අසලට පැමිණ මේ ඇලි ඇතා සිරි පා වදින බව ද මහජනයා සිරි පා වදින්නට යන්නේ එයින් පසුව බව ද ජන ශ්‍රැතිවලින් කියැවෙයි. සබරගමුවේ පැරැණි වනාන්තරවල අලි ඇතුන් බහුල ව සිටි බව ග්‍රාමනාමවලින් පවා ප්‍රකාශ කෙරෙයි. කුරුවිට, කුරුගඟ, ආදිය ඊට නිදසුන් ය. එසේ ම දැනුත් සමනොළ අඩවියේ අලි ඇත්තු වාසය කරති. සමන් දෙවියන් ප්‍රදේශයේ විශ්‍ව ප්‍රමුඛයකු බව තහවුරු කිරීමට මේ ඇත් වාහනය ද හොඳ සාධකයකි. තාක්ෂණය දියුණු වී යාන වාහන නිපැදෙන තුරු ම සමාජයේ ප්‍රභූවරුන් සිය ගමනා ගමනය සඳහා අසුන් ද ඇතුන් ද යොදා ගත් අන්දම ඓතිහාසික සිද්ධි හා බොහෝ දුරට සම්බන්ධ ය. සමන් දෙවියන් එවක සිය වාහනය සේ ඇතකු භාවිත කළ බවට මේ චිරාගත ජන විශ්වාසය සාක්කි දරයි. හස්තියාගෙන් බෝසතාණන් වහන්සේ ද නිරූපණය කොට ඇති අවස්ථා කිහිපයක් පන්සිය පනස් ජාතක පොතෙහි ද සඳහන් වෙයි. ලටුකික ජාතකය හා භූරිදත්ත ජාතකය ඊට නිදසුන් ය. ධවල හස්තියා පුරාණ රාජකීය ලාඤ්ඡනය වී යැයි ද කියනු ලැබේ.[2] සමන් දෙවියන් අති-

1 විමන එ ඇලි ඇතු වාහනාවෙමිනේ - සිරිපා ගමන් මුතුහර නමැති ජන කාව්‍යය.

2 T. S. F. P – Makus Akslaud – Page 41

තයේ විසූ ඇත් දළ වෙළෙන්දෙකු යි තමා අසා ඇති බව පලාබත්ගල ගැමියෙක් අපට පැවසී ය.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළට ආසන්න ව දීඝවාපියට නුදුරින් සමන්තුරෙයි නමැති ස්ථානයක් ඇත්තේ ය. මෙය දැනට විශාල ප්‍රදේශයකි. සමන්තුරෙයි යන දෙමළ ව්‍යවහාරයේ තේරුම "සමන්ගේ තොටුපළ" යන්න ය. මේ ග්‍රාම නාමයට සම්බන්ධ සමන් අපගේ අවධානයට ලක් වන සුමන සමන් දෙවියන් විය හැකි ය. දිවයිනේ නැගෙනහිර දෙසට අධිපති දෙවියා ලෙසට සමන් දෙවියන් පිළිබඳව සැලකෙන සඳහන නිසා ද සමන්තුරෙයි යන ගම්නාම මේ සුමන සමන් දෙවියන් හා සම්බන්ධ වෙති යි සිතන්නට පුළුවන. මෙය පිහිටි ස්ථානය මහියංගණ ප්‍රදේශයට ද එතරම් දුර නොවේ. පුරාණ රුහුණු රාජ්‍යයට මේ පෙදෙස ද අයත් වේ. එබැවින් ප්‍රදේශය පුරා ම සමන් දෙවියන්ගේ අණසක පවතින්නට ඇති බව පිළිගත හැකි ය. මෙහි තිබෙන තොට සමන් දෙවියන්ගේ තොට ලෙස සලකන ලද්දේ එබැවින් විය හැකි ය.

සමන් දෙවියන් ශ්‍රී ලංකාවේ උපන ලද දේශීය දෙවියකු බව ඉහත සඳහන් සාධකවලින් ඉඳුරා ම පැවසෙන බව ඔප්පු වෙයි. සමන්, සමන්තභද්‍ර ලෙස හෝ යම රජු ලෙස හෝ ලක්ෂමණ ලෙස හෝ සැලකීමට වඩා ප්‍රදේශාධිපති ප්‍රමුඛයකු ලෙස විශ්වාස කිරීමට මේ සාධක සියල්ල ඉවහල් කොට ගත හැකි ය. ලක්දිව දේවත්වය ආරූඪ කැරුණු සෙස්සන් ගැන සලකා බලනු විට ද සමන් දෙවියන් පිළිබඳ මේ විශ්වාසය ද එකී චිරාගත සම්ප්‍රදයය ඉක්මවා නො යන බව් පැහැදිලි ය.

තමන්ට සුව සෙත උදා කරමින් යහපත් පාලනයක් ගෙන ගිය ශ්‍රේෂ්ඨ ජන නායකයකු සිය අභාවයෙන් පසුව ජනතාව විසින් දේවත්වයට ආරූඪ කොට ගෙන වඳින්නට පුදන්නට වූ හ යි සමන් දෙවියන් පිළිබඳ මේ පුවත් විමසන විට පැහැදිලි වෙයි. සබරගමුව මැදි කොට ගත් රුහුණු ආශ්‍රිත ප්‍රදේශය මේ නායකයාගේ පාලන ප්‍රදේශය වන්නට ඇත. ඔහු තුළ.

තිබෙන්නට ඇතැ යි ජනතාව සෑළකූ ගුණාංග මූර්තිමත් කොට දක්වීමට ඔවුන්ගේ ප්‍රතිමා නෙළූ කලාකරුවන් ද පෙළඹෙන්නට ඇත. ඉතා ප්‍රසන්න, එනෙත් ප්‍රතාපවත් බවක් පිළිඹිඹු කරමින් සමන් දේව ප්‍රතිමා නෙළා ඇත්තේ එබැවින් යැයි සිතිය හැකි ය. මේ අනුව සමන් දෙවියන් ලංකාවේ දේශීය දේවතා කෙනකු ලෙස නිගමනය කරන්නට පුළුවන. සමන් දෙවියන් විදේශ සම්භවයක් ඇත්තකු ලෙස පිළිගැනීමට පූර්වෝක්ත සාධක ඉවහල් නොවන බව ඉතාමත් පැහැදිලි ය.

# 5

# සමන් දෙවියන් වටා ගෙතුණු රසකතා

සමන් දෙවියන්ගේ බලවත්කම ගැන විශ්වාස කරන බැති මත්හු ඊවුන් හාස්කම් ඇත්තකු ලෙස ද සලකත්. විශේෂයෙන් ම සමනොළ නගින කල කට වරද්ද ගත හොත් එහි අනිසි ඵල විඳින්නට සිදුවන බව ද ඔවුහු විශ්වාස කරත්. එසේ අනිසි විපාක ලැබෙන්නේ සමන් දෙවියන්ගේ බලවත් කමත් හාස්කමත් නිසා ය. සමන් දෙවියන්ට අගෞරව වන කිසිවක් නොකිරීමට මේ නිසා බැතිමත්හු වග බලා ගනිති. සමනොළ වන්දනාවේ යන්නන් හට ආරක්ෂාව සලසා දෙන්නේ ද සමන් දෙවියන් බවට විශ්වාසයක් පවතී. එසේ ම සමන් දෙවියන් තම ප්‍රදේශයට වැස්ස ලබා දෙන බව ද විශ්වාස කරති. මේ අන්දමට සමන් දෙවියන් වටා ගෙතුණු රස කතා රාශියක් ජන ශ්‍රැති වශයෙන් පවතී. මෙහි පළ කරනු ලබන්නේ ඒවායින් කිහිපයකි.

**සමන් දෙවියන් ශ්‍රී පාදය ආරක්ෂා කිරීම:-**

සමනොළ කන්දේ ශ්‍රී පාද ලාංඡනය පිහිටුවා වදාළ බුදුන් වහන්සේ මේ දුෂ්කර ස්ථානයට බැතිමතුන් පැමිණෙන්නේ කෙසේදැ යි සමන් දෙවියන්ගෙන් ඇසුවෝ ලු. එවිට බුදුන් වහන්සේ අමතා, තමන් වන්දනාකරුවන් ආරක්ෂා කරන්නට ඇප වන බව සමන් දෙවියෝ පැවසුවෝ ලු. ඒ නිසා ශ්‍රී පාද වන්දනාවේ යන්නට පෙර සමන් දෙවියන්ට බාරයක් වීමත් ආපසු පැමිණි පසු එය ඔප්පු කැර දෙවියන්ට පින් දීමත් බැතිමතුන්ගේ සිරිත ය.

## සමන් දෙවියන්ගේ කුඩය:-

එක්තරා වේලෙන්දෝ දෙදෙනෙක් බොහෝ කලකට පෙර බෙහෙත් වගයක් සොයන්නට සමනොළ කන්දට නැගුණහ් ලු. ඔසු වග සොයමින් යන ඔවුන්ට රිදී මිටක් සවිකළ කුඩ- යක් ගල් පර්වතයක තිබෙනු දකින්නට ලැබුණේ ලු. එම කුඩය ඇර ගැනීමට ඔවුහු සිතූහ. එහෙත් එය එතැනින් සොල වන්නටවත් බැරි විය. ඒ නිසා මිට කපා කුඩය ගන්නට සිතූ ඔවුහු එය කැපූහ. මිට කපා අවසන් වනවාත් සමඟ ම මහ සුළඟක් විත් කුඩය ඈතට ගසා ගෙන ගියේ ය.

රත්නපුරයේ සමන් දේවාලයේ රාජකාරියේ යෙදෙන තැනැත්තකුට එදු ම රෑ සිහයක් පෙනුණේ ය. සමනොළ කන්දේ රිදී කුඩයක් ඇති බවත් එය රැගෙන ඒම තමාට පව- රන බවත් සිහිනයෙන් පෙනී සිටි අයෙක් කීහ. හෙතෙම පසු ද එළි වූ පසු කුඩය සොයන්නට ගියේ ය. කුඩය හමු විය. එය සමන් දේවාලයට පූජා කෙළේ ය. මෙය තවමත් සමන් දේවාලයේ තිබෙන බව මේ ජනශ්‍රැතියේ සඳහන් වෙයි.

## සමන් දෙවියන්ට රිදී පිඟන්:-

සමන් දේවාලයේ මුරුතැන් වඩන නිලයක් තිබේ. එයින් කියැවෙන්නේ ඒ නිලය හිමි තැනැත්තා සමන් දෙවියන්ට ආහාර පූජා කළ යුතු බව ය. බත් උයා බෙදු දෙවියන්ට පුදන් නේ ඔහු ය. ඔහුට මේ සඳහා කෙසෙල් කොළ සොයා ගෙන එන්නට සිදු වේ. වැසි දිනවල කෙහෙල් කොළ සොයන්නට යැම දුෂ්කර කාර්යයකි. එක් වැසි දිනෙක හෙතෙම, "මේ දෙවියාට කන්ට පිඟානක් වත් නැහැ" යි කේන්තියෙන් කීයේ ලු. එසේ කියමින් ම හෙතෙම වැස්සේ කෙහෙල් කොළ කපන් නට ගියේ ලු. වැස්සෙ දෙවට බැස්ස ඔහුට මහත් දුරක් යන්- නට සිදු වී ලු. කෙතෙක් යන්නට වී ද යත් සමනොළ අඩවියේ මහ ලෙනක් තුළට ම යන්නට සිදුවී ලු. මේ ලෙන තුළ ඉතා වටිනා රන් - රිදී භාජන රාශියක් තිබුණේ ලු. කෙතරම් භාජන තිබුණත් ඔහුට ගන්නට හැකි වූයේ රිදී පිඟන් දෙකක් පමණ ලු. එම රිදී පිඟන් දෙක රැගෙන ආපසු ආ, හේ ඒවා සමන් දෙවි- යන්ට බත් වැඩීම සඳහා සමන් දේවාලයට පූජා කෙළේ ලු.

## සමන් දේවරූපයේ හාස්කමක්:-

සමනොළ කන්දේ දේව කුටියෙහි තැන්පත් කිරීම පිණිස උඳුවප් පෝය ද සමන් දේව රූපය පෙරහැරින් වැඩම කරවන බව මෙයට පෙර ද සඳහන් කරන ලදී. එසේ එය ඔසවාගෙන ගිය එක් කම්කරුවෙක් විඩාවට පත් ව විවේක ගන්නට කඩයක් අසල නැවතුණේ ලු. තමා ඔසවා ගෙන ආ සමන් දේව රූපය සහිත මඤ්ජුසාව කඩයේ බක්කියක් මත තැබූ මෙතෙම විඩා හරින්නට පටන් ගත්තේ ලු. එකෙණෙහි ම මහා සුළඟක් හමා අවුත් කඩයේ වහලය ගැලවී ගියේ ලු. තොරතුරු විම-සන කල ඔවුන්ට දැන ගන්නට ලැබුණේ දේව ප්‍රතිමාව තබා තිබුණේ කරවල බක්කියක් මත බව ය. ඒ අවස්ථාවේ කපු මහතෙක් දේව ප්‍රතිමාව හඳුන් කිරි පැණින් ස්නානය කොට දෙවියන්ට පින් පමුණුවා කමා කොට ගෙන යළිත් ගෞරවාන්විත ලෙස එය සමනොළ කන්ද මුදුනට වැඩම කරවා ගෙන ගියේ ලු. අර අස්වාභාවික සිද්ධිය සිදු වූයේ සමන් දෙව පිළි-මය කරවල බක්කියක් මත තැබීම නිසා යැයි විශ්වාස කරනු ලැබේ.

## කට වරද්ද ගැනීමක්:-

මෙය 1957-58 යන වසර දෙකින් එකකදී සිදුවූවක් ලෙස විස්තර කරනු ලැබේ. කතා පුවත මෙසේ ය. ගුරුවරයෙක් හා ළමයෙක් සිරීපාදේ ගිය හ. ගුරුවරයාත් ළමයාත් කතා කරමින් ''අපට ඉක්මනට යන්ට ඕනෑ'' යි කිහ. ''අපට ඔය මොනවාද 'සුළු වැඩ නොවැ'' යි ළමයා ද කීයේ ය. අන්තිමේ දී ළමයාට සිරීපාදයට යෑමට නො හැකිව අතරමං වූයේ ය. ඔහු හමු වී තිබෙන්නේ දින 07 කට පසුව ලු. මේ ළමයා අතරමංව සිටියේ ආඩියාමළ තැන්න අසල වනාන්තරයේ ලු.

ඒ කාලයේ සිරි පා මළුවට ජලය රැගෙන යන්නේ ආඩියාමල තැන්න අසල ළිඳකිනි. මෙ තැනට ජලය රැගෙන යන්නට ආ තැනැත්තාට වනය දෙසින් 'හූ' හඬක් ඇසිණි. එවිට වතුර ගෙන යන්නට ආ ඒ පුද්ගලයා ද 'හූ' කිය කියා තමාට 'හූ' හඬ නික්මෙන දෙසට ගියේ ලු. එවිට ඔහුට දකින්නට ලැබී

ඇත්තේ නිරුවතින් ම තමා උදෙසට එන ළමයෙකි. තම කරෙහි වූ තුවාය ළමයා ඇන්ද වූ හෙතෙම ඔහු ද කැටුව ආපසු ආවේ ය,

ඉකුත් වූ දිනවල කෑම ආදිය සපයා ගත්තේ කෙසේද යි ළමයාගෙන් විමසූ කල ඔහු කියා ඇත්තේ තම මව විසින් කෑම ගෙනැවිත් දුන් බව ය. ජලය රැගෙන යන්නට ආ පුද්ගලයා ළමයාට කන්නට බොන්ට දුන්නේ ලු. ඉන් පසුව ඔහුට අර ඉකුත් වූ දින හත ගැන තිබූ මතකය අමතක වී ගියේ ලු.

## උපග්‍රන්ථය 1

### මේ පොත සම්පාදනයේදී තොරතුරු සැපයීමෙන් උපකාර කළ අයගේ නාම ලේඛණය.

1 ශ්‍රී පාදස්ථානාධිපති හා කිරිඇල්ල නැදුන් රාජ මහා විහාරාධිපති හඳපාන්ගොඩ ගරු විමල ස්වාමීන් වහන්සේ - නැදුන් රජපහ වෙහෙර, කිරිඇල්ල.

2 සබරගමු පළාතේ ප්‍රධාන සංඝනායක වේහැල්ලේ ගරු ධම්මපාල ස්වාමීන් වහන්සේ - මිගහගොඩ පුරාණ විහාරස්ථානය, පැල්මඩුල්ල.

3 මහාචාර්ය කඹුරුපිටියේ ගරු වනරතන ස්වාමීන් වහන්සේ - සිරි රතනජෝති පිරිවෙන, ඌරාපොළ, තිහගොඩ.

4 තැම්පාවේ ගරු පේමරතන ස්වාමීන් වහන්සේ - ශ්‍රී පාදස්ථානය, මස්කෙළිය.

5 දික්වැව ගරු රතනසාර ස්වාමීන් වහන්සේ - දක්ෂිණ රජමහ විහාරය, මිද්දෙණිය.

6 නෙල්ලිවල විමලසාර හිමි - පින්නවල, බලංගොඩ.

6 රාමගිරි කපුරාළලාගේ ලොකු මහත්මයා මහතා - රිදිවිට, ගිරඹඩගම. (ශ්‍රී පාද සමන් දේවාලයේ කපු මහතා)

7 විජය නාරායන කපුරාළලාගේ විජයවර්ධන මහතා - රත්නපුර (සමන් දේවාලයේ කපු මහතා)

8 ජේ. ඇම්. ඩිංගිරිබණ්ඩා මහතා - උඩත්තව, බටුමුල්ල (මහියංගණ සමන් දේවාලයේ කපු මහතා)

9 වීරසිංහ කරුණානායක මහතා - ප්‍රජා ගුවන් විදුලි සේවය, ගිරාදුරුකෝට්ටෙ.

10 තලාවරිගෙ සුදුබණ්ඩියා - හෙන්නානිගල, නවමැදගම. (වැදි පරපුරේ අයෙකි)

11 සොරබොර පෝරුගම්පොජ්ජේ දවුටල ඇත්තෝ - සොරබොර, මහියංගණය.

12 පී. එස්. අසනේරිස් මහතා - පලාබත්ගල. (ශ්‍රී පාදයේ පාරිසරක කිරීම් ආදී වැඩවල යෙදුණා)

13 එන්. කේ. පැලිස් සිඤ්ඤෝ මහතා - ශ්‍රී පලාබත්දල (ශ්‍රී පාදස්ථානයේ නතර වී වැඩ කළා)

14 බී. ටී. පෙරේරා මහතා - බලංගොඩ.

15 කේ. බැරණ්දෙනිය මහතා - මැද්දකන්ද, බලංගොඩ.

16 පද්මකුමාර කළුබෝවිල මහතා - කරදන.

# උපග්‍රන්ථය 2

## ආශ්‍රිත පොත පත


1. අපේ යම ගියාව - ඩී. තෙන්නකෝන්, ඇම්. ඩී. ගුණසේන සමාගම, කොළඹ 1962
2. දඩුරු ඔය බඩ ජන ඇදහීම් – ඇන්. ටී. කරුණාතිලක, ගොඩගේ සහෝදරයෝ, කොළඹ 1958
3. දීපවංශය – කිරිඇල්ලේ ඤාණවිමල සංස්.
4. පුරාණ යුගය – ඉතිහාස පොත් අංක 2, තිසර ප්‍රකාශකයෝ, දෙහිවල 1962
5. නාට්‍ය ශාස්ත්‍රය – භරතමුනි, සුචරිත ගම්ලත් සංස්, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ
6. පරංගි යුගයේ හෙළදිව – ඩී. පී. පොන්නම්පෙරුම, ලංකා ප්‍රකාශන. පේරාදෙණිය 1969
7. ෆාහියන්ගේ දේශාටන වාර්තාව – බලගල්ලේ විමලබුද්ධි සංස්. 1958
8. පැරණි ලංකාවේ ආගම් හා පුද පූජා – එස්. කේ. ජයවර්ධන, ගුණසේන සමාගම, කොළඹ
9. මණිමේඛලා චම්පු – හිස්සැල්ලේ ධම්මරතන හිමි සංස්. ඔරියන්වල් යන්ත්‍රාලය, කොළඹ
10. මාතර මානව වංශය – කඹුරුපිටියේ වනරතන හිමි, බ්‍රෝඩ්වේ යන්ත්‍රාලය, මාතර 1950
11. රුහුණේ ඇදහිලි හා විශ්වාස – පොලොම්මාරුවේ හේමසිරි හිමි, තරංජි ප්‍රින්ටර්ස්, නුගේගොඩ
12. ලක්දිව මහායාන අදහස් – මොරටුවේ සාසනරතන හිමි, ඇම්. ඩී. ගුණසේන සමාගම, කොළඹ 1962
13. ලාංකික දෙවිවරු – මාපොටේ චන්දජෝති හිමි, ඇහැලියගොඩ 1954
14. ලංකා ඉතිහාසය – විද්‍යාලංකාර පරිවර්තනය, 1 භාගය
15. වදන් කවි පොත
16. විදේශීන් දුටු පුරාණ ලංකාව – ඩී. පී. පොන්නම්පෙරුම, ආයර් මුද්‍රණාලය මහනුවර 1961
17. සද්ධර්මරත්නාකරය – ධර්මකීර්ති සංස්, විද්‍යා භූෂණ යන්ත්‍රාලය, කොළඹ
18. සබරගමුවේ පැරණි ලියවිලි – කිරිඇල්ලේ ඤාණවිමල හිමි, 1942
19. සබරගමු දර්ශන – කිරිඇල්ලේ ඤාණවිමල හිමි, ශාස්ත්‍රෝදය, රත්නපුර, 1967
20. සමන්තකූට වණ්ණනා – කිරිඇල්ලේ ඤාණවිමල හිමි සංස්, 1967
21. සැළලිහිණි සන්දේශය – කේ. ටී. ඩබ්ලිව්. සුමනසූරිය සංස්
22. සැවුල් සන්දේශය - ආර්. පෙරේරා සංස්
23. සිංහල විශ්ව කෝෂය ii කාණ්ඩය, කොළඹ
24. හංස සන්දේශය – ක්‍රිස්ටි ද සිල්වා සංස්


## පුවත් පත් සඟරා


1. සමන් දෙවොලට ලක්‍ෂමණ වැදුනු හැටි – අබය ආර්යසිංහ, දිනමිණ
2. සිරි පා පුරාණය – සෙනරත් පරණවිතාන, රසවාහිනී
3. ශ්‍රී පාද සාහිත්‍යය – කේ. විජිතනන්ද හිමි, රසවාහිනී
4. අලුත් නුවර දැඩිමුණ්ඩ දෙවියෝ – ධර්මසිරි සේනානායක, දිනමිණ

## ENGLISH BOOKS

1 Ancient Ceylon – H. Parker Luzac & Co. London 1909
2 An Historical Relation of Ceylon Robert Knox – Colombo 1895
3 Ceylon - Sir J. E. Tennent - London 1860
4 Ceylon - Henry Marshal – Tisara, Dehiwala
5 Ceylon History in Stone – Lake House; Colombo
6 Ceylon Antiquary 1919 July
7 Inscription of Ceylon – S. Paranavitana, Department of Archaeology , Ceylon 1970
8 Jungle Tide - Hansa Ed. Colombo 1971
9 Journal Royal Asiatic Society – Ceylon Vol. xvi 1889
10 Seeing Ceylon – R. L. Brohier, Lake House, Colombo
11 The God of Adam's Peak – S. paranavitana, Artibus Asiae Publishers, Switzerland, 1957
12 Tomb Stone and Monuments in Ceylon – J. Penry Lewis, Colombo, 1913

## MAGGAZINES

Mahasaman Devale and its Sannasa by H, C. P. Bell, Ceylon Antiquery. 1951 July, P. 36

The Inscribed Mural Stone at The Mahasaman Devale Ratnapura – By D. W. Ferguson, Jurnal R. A. S. (Ceylon) xvi Page 84

## වචන අනුක්‍රමණිකාව


අ

අලගියවන්න මුකවැටි 19,29
අඟුල 38
අය්‍යනායක 22,58
ආදම් ගේ පා සටහන 12
ආර්යකාමදේව ඇමැති 26,27,29,30
ආර්යසිංහ අබය 37,54
ඇසල පෙරහර 35

ඉ

ඉබන් බටුතා 12,14
ඉබන් ඛුර්දද්බෙ 12
ඉර සේවය 13

ක

කජ් සිටුවීම 35
කැලණිය 17
කුරුවිට 14
කුඹල් පෙරහර 35
කුරුවිට රාළ 32
කෙම්මුර 24
කෝලම් 37

ග

ගල්පොත්තාවෙල පන්සල 24,25

ජ

ජනශ්‍රැති 52,59,65
ජන විශ්වාස 40
ජන සාහිත්‍යය 61
ජෝන් ස්ටීල් 13

ද

දඹදෙණි යුගය 23
දැරණියගල 32,44,45
දිය කැපීම 37
දීපවංශය 16,18
දේවප්‍රතිරාජ 24

න

නීල පෙරුමාල් 31,54

ප

පරුමුක 60
පරණවිතාන සෙනරත් 39
පලාබත්ගල 26,62
පැරකුම්බා සවැනි 31,54
පැල්මඩුල්ල 24
පූජාවලිය 17,23,25
පර්‍යාභියන් 12
පෘතුගීසීන් 29,32,33,34

බ

බමුණු බලපෑම් 31,37,53
බළංගොඩ 13.42
බුදුන් වහන්සේ 40
බොක්සැල් 19
බොල්තුඹේ 22,42.43
බෝපත්පිටි ඇල්ල 11

ම

මහවැලි ගඟ 11,42
මහබඹා 35,36
මහලොකු දේවතාවිය 40,41
මහියංගණය 9,15,22,39,60
මහාවංශය 16,59
මහා විහාරය 16
මහා පරාක්‍රමබාහු 23
මණිමේකලා කාව්‍යය 12
මුනි සිරිපා සටහන 14

ය

යමරජ 52
යම්දේවතා 48,50,52
යක්ෂ ගෝත්‍රිකයෝ 59

ර

රාජාවලිය 11,23
රාම-රාවණ 43,55
රොබට් නොක්ස් 10

ල

ලක්ෂමණ 31,46,53,54
ලක්ෂමණ මහා දේවාලේ 31,48
ලිංගික ජීවිතය 35,36

ව

වැද්දෝ 41,59
වැදි පෙරහර 41,42

ශ

ශ්‍රී පාද කන්ද 9
ශ්‍රී පාද ලාඤ්ජනය 30

ස

සමන් දෙවියෝ 9 15,17,27
සමන් සිරිත 26,28
සබරගමු සමන් දේවාලය 26,34
සද්ධර්ම රත්නාකරය 17
සමන් දේව ඇදහිල්ල 16
සමිධි සුමන 16,56
සමනොළ කන්ද 9,10,15
සමන්තභද්‍ර 39,51,57,62
සමනොළ අඩවිය 9
සතරවරම් දෙවියෝ 56
සමන්තකූටය 9,10,11,12,18
සමන්තපාසාදිකා 16,18
සමන්තකූට වණ්ණනා 17,18
සැවුල් සන්දේශය 39
සීතගඟුල 25
සුමනකූට 9,15
සුමන සමන් 48,49

හ

හංස සන්දේශය 19,56
හේනෙමාමා 38

26569

# සමන් දෙවියෝ

ඊ. ඇම්. රත්නපාල
(බී. ඒ. අධ්‍යාපන ඩිප්. ඇම්. ඒ.)



පොදු ජනතාවගේ ඇදහිල්ලට පාත්‍ර ව සිටින සමන් දෙවියන් පිළිබඳ ව විමර්ශනාත්මක දෘෂ්ටියකින් බැලීම මේ පොතේ අරමුණ ය. සමන් දෙවියෝ කවුදැයි හඳුනා ගනු පිණිස මේ විමර්ශනය බෙහෙවින් වැදගත් වෙයි. සමන් දෙවියන් පිළිබඳ ව පවත්නා විවිධ මත මේ කතුවරයාගේ විමර්ශනයට ලක් වෙයි. එමගින් මේ කෙරෙහි පාඨක මනස වැඩි දුරටත් මෙහෙයවයි.

මේ කතුවරයාගේ මෙ වැනි ම ශාස්ත්‍රීය නිබන්ධ කිහිපයක් මෙයට පෙර ද මුද්‍රණයෙන් පල වී තිබේ.

**ISBN 955–20–0702–X**

පිට කවරය : තේමියදාස් කන්දෙවත්ත

මිල රු. 75.00

**එස්. ගොඩගේ සහෝදරයෝ**
675, පී. ද ඇස්. කුලරත්න මාවත
කොළඹ 10

**National Digitization Project**

***National Science Foundation***

Institute : Sabaragamuwa University of Sri Lanka

1. Place of Scanning : Sabaragamuwa University of Sri Lanka, Belihuloya

2. Date Scanned : ..2017-10-03..........................................................

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : ....S. A. C. Sadaruwan.........................................

Signature : ..........................................................................

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : LIBRARIAN.......................................................................

Name : T.N. NEIGHSOOREI.......................................................................

Signature : .......................................................................

Date : ..2017-10-03.........

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*